# 7

# මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය

## 7.1 සමස්ත නිරීක්ෂණ

*ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසරේදී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ඉතා දැඩි කළ අතර එසේ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම හරහා අධික ලෙස ඉහළ යන මිල පීඩන සහ අඛණ්ඩව වැඩි වන උද්ධමනය මැඩපැවැත්වීම මෙන්ම උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සහ යටිදැරි ඉල්ලුම් පීඩන වැළැක්වීම අරමුණු විය. නිදහසින් පසු ආර්ථිකය මුහුණ දුන් දරුණුතම ගෙවුම් ශේෂ අර්බුදය මධ්‍යයේ විදේශීය අංශයේ පැවති පෙර නොවූ අන්දමේ අවදානම් සමනය කිරීමට සහ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ අවිනිශ්චිතතා වර්ධනය වීම මධ්‍යයේ රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සම්බන්ධයෙන් පවතින අවදානම් ඉහළ යෑම හේතුවෙන් පොලී අනුපාතික ව්‍යුහයෙහි සිදු වන විෂමතා අවම කිරීම සඳහා එලෙස මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම අවශ්‍ය විය. දේශීය සැපයුම් අංශයේ බාධා, ගෝලීය ඛනිජ තෙල් හා වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හා සමගාමීව දිගු කාලයක් ප්‍රමාදව පැවති පරිපාලිත මිල ගණන් සංශෝධන සහ එමගින් අනෙකුත් අංශවලට ඇති වූ බලපෑම්, ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීමේ බලපෑම වේගයෙන් ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීම සහ කොවිඩ්-19 වසංගත කාලය තුළ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ පසු බලපෑම ඇතුළු සාධක රාශියක් හේතුවෙන් මෙම වසර තුළදී මිල පීඩන ඉහළ ගියේය. දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ බලපෑම පිළිබිඹු කරමින් දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව හිඟ තත්ත්වයක පැවති අතර ණය සහ තැන්පතු පොලී අනුපාතික ඉහළ යෑම මගින් මුදල් සහ ණය ප්‍රසාරණය සීමා විය. දැඩි මුදල් ප්‍රතිපත්තිය ශීඝ්‍රයෙන් වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම, ඉහළ ද්‍රවශීලතා හිඟය සහ අවදානම් ඉහළ යෑම පිළිබිඹු කරමින් විශේෂයෙන් වෙළඳපොළ ණය සහ තැන්පතු පොලී අනුපාතික මාස කිහිපයක් තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මීට ප්‍රතිචාර වශයෙන්, පෞද්ගලික අංශය විසින් ලබා ගත් ණය ප්‍රසාරණයට සැලකිය යුතු ලෙස බලපෑමක් සිදු කරමින් 2022 ජූනි මාසයේ සිට මාසිකව ණය සංකෝචනය අඛණ්ඩව සිදු වූ අතර එමගින් පුළුල් මුදල් සැපයුම සහ ණය ප්‍රසාරණය විශාල ලෙස මන්දගාමී විය. දැඩි මුදල් තත්ත්වයේ බලපෑම සහ ගෙවුම් ශේෂ පීඩන අඩු වීමත් සමඟ සැපයුම් අංශයේ ඇති වූ වර්ධනයන් 2022 වසරේ අවසාන කාලයේදී මිල පීඩන පාලනය කිරීමට උපකාරී විය. මතුපිට උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේදී උපරිම අගයක් දක්වා ඉහළ ගිය අතර එතැන් සිට ස්ථාවර නිර්-උද්ධමන මාවතක ගමන් කරමින් පවතී. කෙසේ වෙතත්, විදේශීය ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවන බවට 2022 අප්‍රේල් මාසයේදී ප්‍රකාශයට පත් කිරීමෙන් පසු විදේශීය මූල්‍යන සඳහා ප්‍රවේශය සීමා වීම සහ රජයේ ආදායම පහළ යෑම මධ්‍යයේ බැංකු පද්ධතිය මගින් රජය වෙත ලබා දුන් ණය ප්‍රමාණය වසර තුළදී සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතුණි. රජයේ ණය ගැනීමේ අවශ්‍යතාව අඛණ්ඩව ඉහළ යෑම මෙන්ම දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳව පැවති අවිනිශ්චිතතා හේතුවෙන් වසර තුළදී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික විශාල ලෙස වැඩි වී ඉහළ මට්ටම්වල පැවතිය ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සඳහා වූ වැඩසටහන පිළිබඳ සාකච්ඡා අවසන් අදියරේ පැවතීම මත*

*වෙළඳපොළ අපේක්ෂා වර්ධනය වෙමින් පැවතීමත් සමග 2022 වසරේ අවසාන කාලයේදී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකවල යම් අඩු වීමක් දක්නට ලැබුණි. මේ අතර, රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඉහළ යෑමත් සමග අධික ලෙස ඉහළ ගිය වෙළඳපොළ පොලී අනුපාතික පහළ දැමීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් සිදු කරන ලද මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයට සමගාමීව වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික මෙන්ම කෙටි කාලීන වෙළඳපොළ ණය පොලී අනුපාතික ද ක්‍රමයෙන් පහළ යෑම ආරම්භ විය. තවද, දිගු කාලීන පදනම මත ද්‍රවශීලතාව ලබා දෙමින් මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා පීඩන අඩු කිරීමට මහ බැංකුව පියවර ගත් අතර මහ බැංකුවේ නිත්‍ය පහසුකම් මත වාණිජ බැංකු අධික ලෙස රඳා පැවතීම ද අඩු කළේය. එමගින් මෙතෙක් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීමේ ප්‍රමාණයට අසමානුපාතිකව අධික ලෙස ඉහළ ගිය පොලී අනුපාතික ව්‍යුහය ක්‍රමයෙන් පහළ යෑම සඳහා පහසුකම් සැලසුණි. මේ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි සම්පූර්ණ කිරීමට නියමිත අවසාන 'පූර්ව ක්‍රියාමාර්ගය' සපුරාලීම සඳහා මහ බැංකුව 2023 මාර්තු මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීය. මෙමගින් ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ වෙළඳපොළ පොලී අනුපාතික අතර පරතරය තවදුරටත් අඩු කිරීමට උපකාරී විය. ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල මෙම වැඩි වීම හමුවේ වුවද 2022 වසරේ අවසාන කාලයේ සිට මහ බැංකුව විසින් සපයන ලද වෙළඳපොළ මාර්ගෝපදේශයන්ට අනුකූලව වෙළඳපොළ පොලී අනුපාතික අඩු වීමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතිණි. මුදල් ප්‍රතිපත්ති සහ අනෙකුත් ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් මතුපිට උද්ධමනය 2023 වසරේ අග භාගය වන විට තනි අගයක මට්ටමට ළඟා වී මැදි කාලීනව ඉලක්කගත මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම, උද්ධමනය පහළ යෑම සහ දේශීය ණය ප්‍රශස්තකරණය සඳහා විකල්පයන් පිළිබඳ වඩාත් පැහැදිලි දැනුම්වත් වීමක් ලැබීමෙන් පසු සහ එහි ප්‍රතිඵලයක් ලෙස රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සම්බන්ධයෙන් වන ඉහළ අවදානම් අඩු වීමේ සහායයෙන් වෙළඳපොළ පොලී අනුපාතිකවල මෙතෙක් දක්නට ලද පහළ යෑම ඉදිරි කාල සීමාව තුළදී අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙමගින් මුදල් තත්ත්වයන්හි පවතින සැලකිය යුතු දැඩි බව ලිහිල් කිරීමට මෙන්ම පෞද්ගලික අංශයට ලබා දෙන ණය ක්‍රමානුකූලව ඉහළ නැංවීමට උපකාරී වනු ඇත. මේ අතර, ඉදිරියේදී බලාත්මක කිරීමට නියමිත මහ බැංකු නීති පනත හරහා රාජ්‍ය මූල්‍ය බලපෑම් අවම වීම මගින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී වඩාත් හිතකර තත්ත්වයක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.*


## 7.2 මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය

**උද්ධමන පීඩන වැළැක්වීමට සහ උද්ධමන අපේක්ෂා ඉහළ යෑමට ඇති හැකියාව සැලකිල්ලට ගනිමින් 2021 අගෝස්තු මාසයේ සිට ආරම්භ වූ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය 2022 වසරේදීත් මහ බැංකුව අඛණ්ඩව පවත්වාගෙන ගියේය.** විදේශීය හා රාජ්‍ය මූල්‍ය අංශයේ අසමතුලිතතා මධ්‍යයේ උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික හා වෙළඳපොළ පොලී අනුපාතික අතර පැවති විශාල විෂමතාව සැලකිල්ලට ගනිමින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ආරම්භ වූ 2021 අගෝස්තු මාසයේ සිට 2022 වසර අවසානය වන විට මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ප්‍රතිශතාංක 10කින් ඉහළ නැංවූ අතර එම ඉහළ නැංවීමෙන් වැඩි ප්‍රමාණයක් එනම් ප්‍රතිශතාංක 7කින් ඉහළ නැංවීම 2022 අප්‍රේල් මාසයේදී සිදු කළේය. 2020 මුල් කාලයේ කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම ආරම්භයේ සිට අඛණ්ඩව ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් පවත්වා ගැනීම සහ 2022 මාර්තු මාසයේදී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල විශාල වශයෙන් අවප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස උද්ධමන ඉදිරි දැක්ම කෙරෙහි පැවති අහිතකර අවදානම් හේතුවෙන් මහ බැංකුවට ප්‍රතිපත්ති පොලී අනුපාතික 2022 අප්‍රේල් මාසයේදී ප්‍රතිශතාංක 7කින් සහ 2022 ජූලි මාසයේදී තවත් පදනම් අංක 100කින් ඉහළ නැංවීමට සිදු විය. ඉල්ලුම හේතුවෙන් ඇති වූ උද්ධමන පීඩන ඉහළ යෑම පාලනය කිරීමට සහ අහිතකර උද්ධමන අපේක්ෂා ඇති වීම වැළැක්වීමට මෙන්ම විදේශීය අංශයේ පීඩන ලිහිල් කිරීම සහ පොලී අනුපාතික ව්‍යුහයේ නිරීක්ෂණය වූ විෂමතා නිවැරදි කිරීමට එවැනි මුදල් තත්ත්වයන් දැඩි කිරීම් උපකාරී විය. මීට අමතරව, තෝරාගත් ණය උපකරණ මත මෙන්ම විදේශ විනිමය තැන්පතු සඳහා පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කරන ලද අතර ඒ හරහා මුදල් තත්ත්වයන් දැඩි කිරීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්වීම් කාර්යක්ෂම ලෙස වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම සඳහා අවකාශ සැලසීය. දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට සහාය දැක්වීම සඳහා 2022 වසර තුළදී දේශීය මුදල් වෙළඳපොළෙහි එක් දින ද්‍රවශීලතාව සෘණ මට්ටම්වල පවත්වාගෙන ගිය


7

## රූප සටහන 7.1
## මුදල් අංශයේ ප්‍රවණතා

### ශ්‍රී ලංකා මහ බැංකුව මිල ස්ථායීතාවය යථා තත්ත්වයට පත් කිරීමේ අරමුණින් ක්‍රියාමාර්ග ගණනාවක් ගනු ලැබීය




### පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය වර්ධනය අඛණ්ඩව පහළ ගියේය




7

### 7.1 සංඛ්‍යා සටහන
### මෑත කාලීන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

| දිනය | ක්‍රියාමාර්ගය |
|---|---|
| 2020 ජනවාරි 30 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 6.50% සහ 7.50% දක්වා අඩු කරන ලදී. |
| 2020 මාර්තු 17 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 6.25% සහ 7.25% දක්වා අඩු කරන ලදී. |
| 2020 මාර්තු 17 | 2020 මාර්තු මස 16 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1.00කින් 4.00% දක්වා අඩු කරන ලදී. |
| 2020 මාර්තු 27 | කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට සහාය වීම සඳහා 4.00% පොලී අනුපාතිකයක් යටතේ රුපියල් බිලියන 50ක් දක්වා වූ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම (ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය - පළමු අදියර) හඳුන්වාදෙන ලදී. |
| 2020 අප්‍රේල් 03 | 2020 අප්‍රේල් මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 6.00% සහ 7.00% දක්වා අඩු කරන ලදී. |
| 2020 මැයි 06 | 2020 මැයි මස 06 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.50% සහ 6.50% දක්වා අඩු කරන ලදී. |
| 2020 ජූනි 16 | 2020 ජූනි මස 16 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2.00කින් 2.00% දක්වා අඩු කරන ලදී. |
| 2020 ජූනි 16 | කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට සහාය වීම සඳහා 4.00% පොලී අනුපාතිකයක් යටතේ 2020 මාර්තු 27 දින හඳුන්වා දුන් සහනදායී ණය පහසුකම රුපියල් බිලියන 150ක් දක්වා ඉහළ නංවන ලදී (සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම - දෙවන අදියර). |
| 2020 ජූලි 09 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, 4.50% සහ 5.50% දක්වා අඩු කරන ලදී. |
| 2021 අගෝස්තු 19 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.00% සහ 6.00% දක්වා වැඩි කරන ලදී. |
| 2021 අගෝස්තු 19 | 2021 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2.00කින් 4.00% දක්වා වැඩි කරන ලදී. |
| 2022 ජනවාරි 20 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.50% සහ 6.50% දක්වා වැඩි කරන ලදී. |
| 2022 මාර්තු 04 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, 6.50% සහ 7.50% දක්වා වැඩි කරන ලදී. |
| 2022 මාර්තු 07 | විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැළපීමක් සඳහා ඉඩ හරින ලදී. |
| 2022 අප්‍රේල් 08 | 2022 අප්‍රේල් මස 08 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 700කින්, පිළිවෙළින්, 13.50% සහ 14.50% දක්වා වැඩි කරන ලදී. |
| 2022 මැයි 12 | විදේශ විනිමය වෙළඳපොළ විධිමත්ව හැසිරීම පහසු කිරීම සහ විනිමය අනුපාතිකයෙහි දෛනිකව සිදුවන අතිසි උච්ඡාවචන කළමනාකරණය කිරීම සඳහා 2022 මැයි මස 13 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළ ගනුදෙනු සඳහා අදාළ වන එ.ජ. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් විචල්‍ය ආන්තිකයක් ද සමඟ දිනපතා ප්‍රකාශයට පත් කිරීමට නියමිත එ.ජ. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් මධ්‍ය විනිමය අනුපාතිකයක් හඳුන්වාදීම. |
| 2022 ජූලි 07 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, 14.50% සහ 15.50% දක්වා වැඩි කරන ලදී. |
| 2023 ජනවාරි 02 | 2023 ජනවාරි මස 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගැනීම දින දර්ශිත මසකට උපරිම අවස්ථා පහක් (05) දක්වා සීමා කරන ලදී. මීට අමතරව, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා නිත්‍ය ණය පහසුකම ලබා ගැනීම අදාළ දිනකදී එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයෙන් සියයට 90ක් දක්වා සීමා කෙරිණි. |
| 2023 මාර්තු 03 | 2023 මාර්තු මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, 15.50% සහ 16.50% දක්වා වැඩි කරන ලදී. |
| 2023 මාර්තු 03 | 2023 මාර්තු මස 07 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එ.ජ. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් මධ්‍ය විනිමය අනුපාතිකය සහ විචල්‍ය ආන්තිකය නිවේදනය කිරීම හරහා වෙළඳපොළ මාර්ගෝපදේශ නිකුත් කිරීම නතර කරන ලදී. |

සටහන: මහ බැංකුව විසින් පහත පරිදි පොලී අනුපාතික මත උපරිම සීමා පනවන ලදී/ සංශෝධනය කරන ලදී.


- 2020.04.27: බලපත්‍රලාභී බැංකුවල උකස් පහසුකම් මත උපරිම පොලී අනුපාතික සීමා පනවන ලදී.
- 2020.08.24: බලපත්‍රලාභී බැංකුවල තෝරා ගත් ණය උපකරණ මත පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා තවදුරටත් අඩු කරන ලදී.
- 2020.11.26: බලපත්‍රලාභී බැංකුවල දේපළ ඇපකර සහිත නිවාස ණය සඳහා උපරිම පොලී අනුපාතික සීමා පනවන ලදී.
- 2021.08.24: බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත උපරිම සීමා පනවන ලදී.
- 2021.12.30: බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත පැනවූ උපරිම සීමා සංශෝධනය කරන ලදී (දින 364 භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික හා සම්බන්ධ කරන ලදී)
- 2021.12.31: බලපත්‍රලාභී බැංකුවල දේපළ ඇපකර සහිත නිවාස ණය මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා සංශෝධනය කරන ලදී (බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය හා සම්බන්ධ කරන ලදී).
- 2022.03.04: බලපත්‍රලාභී බැංකුවල තෝරාගත් ණය උපකරණ මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා වැඩි කරන ලදී.
- 2022.03.11: බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කරන ලදී.
- 2022.04.21: බලපත්‍රලාභී බැංකුවල තොරාගත් ණය උපකරණ මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කරන ලදී.

බැංකු අනුපාතිකය මුදල් ප්‍රතිපත්ති උපකරණ ලැයිස්තුවෙන් ඉවත් කළ අතර එය මහ බැංකුව අවසාන ණය දෙන්නා ලෙස බැංකු හා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට සහාය වීමට භාවිත කරන ප්‍රතිපත්ති උපකරණයක් ලෙස සලකනු ලබයි (2023.03.01 සිට බලපැවැත්වෙන පරිදි).

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අතර මුදල් වෙළඳපොළෙහි මෙහෙයුම් සඳහා අවශ්‍ය ද්‍රවශීලතාව නිත්‍ය ණය පහසුකම හරහා ලබා දෙන ලදී. ප්‍රධාන වශයෙන් අත්‍යවශ්‍ය ආනයන සහ රජයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සඳහා පහසුකම් සැලසීමේදී මහ බැංකුව විසින් සිදු කරන ලද විදේශ විනිමය ගනුදෙනුවල බලපෑම හේතුවෙන් 2022 වසරේ මැද භාගයේදී දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව සැලකිය යුතු ලෙස සෘණ අගයක් විය. කෙසේ වෙතත්, රජයේ මුදල් ප්‍රවාහ අවශ්‍යතා සඳහා සහාය දැක්වීමට මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලදී ගැනීම සහ ඉහළ තැන්පතු පොලී අනුපාතික හමුවේ බැංකු පද්ධතිය වෙත මුදල් ආපසු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස විශාල සෘණ ද්‍රවශීලතා මට්ටමෙහි ක්‍රමානුකූල අඩු වීමක් ඉන් පසුව දක්නට ලැබුණි. ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම සහ ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ අවිනිශ්චිතතා මධ්‍යයේ රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් පවතින අවදානම් ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ නොවැම්බර් මාසය වන තෙක් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දැඩි මුදල් තත්ත්ව වේගයෙන් වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම පිළිබිඹු කරමින් වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර බොහෝ අනුපාතික ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම මට්ටම් වාර්තා කළේය. කෙසේ වෙතත්, වෙළඳපොළ පොලී අනුපාතික හා සැසඳීමේදී රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් පවතින ඉහළ අවදානම්වල බලපෑම හේතුවෙන් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීමට සමානුපාතික නොවන ලෙස අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ ගියේය. මේ හේතුවෙන් මහ බැංකුව ශිෂ්ට ප්‍රයෝග ක්‍රියාත්මක කරමින් 2022 නොවැම්බර් මාසයේ සිට අධික ණය සහ තැන්පතු පොලී අනුපාතික අඩු කරන ලෙස බැංකුවලින් ඉල්ලා සිටියේය. ප්‍රතිපත්ති පොලී අනුපාතිකවලට වඩා ඉහළ මට්ටමක පවත්වා ගෙන ගිය වෙළඳපොළ පොලී අනුපාතික අඩු කිරීමේ අවශ්‍යතාව පිළිබඳව මහ බැංකුව විසින් කිහිපවරක් සිදු කරන ලද ඉල්ලීම්වලට අනුකූලව 2022 වසර අවසාන කාලයේදී වෙළඳපොළ පොලී අනුපාතිකවල යම් පහළ යෑමක් දක්නට ලැබුණ ද එම පොලී අනුපාතික 2022 වසර තුළදී ඉහළ මට්ටම්වල පැවතුණි. පෙර නොවූ අන්දමේ ආර්ථික අර්බුද මධ්‍යයේ දැඩි මුදල් තත්ත්ව සහ සමස්ත ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම පිළිබිඹු කරමින් බැංකු පද්ධතිය විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය අඛණ්ඩව පහළ ගියේය. මේ අතර, මෙතෙක් වාර්තා වූ වැඩිම ණය සංකෝචනය පිළිබිඹු කරමින්

**7.2 රූප සටහන**
**ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණවල සහ මෙහෙයුම් ඉලක්කයේ හැසිරීම (අ)**




(අ) අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ අක්‍රියව පැවති දින සඳහා බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයන් වාර්තා නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2022 ජූනි මාසයේ සිට 2023 පෙබරවාරි මාසය දක්වා කාලය තුළදී පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය මාසිකව සංකෝචනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2022 වසර අවසානය වන විට සියයට 6.2ක් දක්වා අඩු වූ අතර 2020 ජූලි මාසයෙන් පසු අඩුම වර්ධනය වාර්තා කරමින් 2023 පෙබරවාරි මස අවසානය වන විට එය සියයට 3.0ක් දක්වා තවදුරටත් මන්දගාමී විය. කෙසේ වෙතත්, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ බලපෑම යම් ප්‍රමාණයකට පිළිබිඹු කරමින් බැංකු පද්ධතිය වෙතින් රජය සතු වාණිජ ව්‍යාපාර ලබා ගත් ණය 2022 වසර තුළදී ඉහළ ගියේය. තවද, රජයට ලබා දුන් විශාල මූල්‍යන මධ්‍යයේ මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන 2022 වසර තුළදී බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ද ඉහළ ගියේය. පහළ යමින් පවතින විදේශීය මූල්‍යන සහ රාජ්‍ය ආදායම් හිඟය මධ්‍යයේ රජයේ මුදල් ප්‍රවාහය මත වන පීඩනය ලිහිල් කිරීම සඳහා තාවකාලික පියවරක් ලෙස එවැනි මූල්‍යන රජයට ලබා දීමට මහ බැංකුවට සිදු විය. මහ බැංකුව විසින් රජයට ලබා දුන් එම මූල්‍යනයෙන් වැඩි කොටසක් බහුපාර්ශ්වික ණය දෙන ආයතනවල විදේශ විනිමය ණය සේවාකරණයට අවශ්‍ය විදේශ විනිමය මිලදී ගැනීම සඳහා නැවත මහ බැංකුව වෙත ලබා දෙන ලදී. කෙසේ වෙතත්, යෝජිත මහ බැංකු පනත යටතේ මහ බැංකුවෙන් රජයට මූල්‍යන ලබා දීම සීමා වනු ඇති අතර එමගින් ඉදිරි කාලය තුළදී මුදල් ප්‍රතිපත්ති ස්වාධීනත්වය ශක්තිමත් කරනු ඇත. මේ අතර, යටිදැරි උද්ධමනය සහ උද්ධමන අපේක්ෂා අවශ්‍ය පරිදි පාලනය කිරීම සහතික කිරීම සඳහා මහ බැංකුව 2023 වසරේ මේ දක්වා කාලය තුළදී සිය දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගනු ලැබීය. කෙසේ වෙතත්, දිගු කාලයක් පුරා දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවති විශාල ද්‍රවශීලතා හිඟය හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික මත වූ ඉහළ පීඩනය පාලනය කිරීම සඳහා මහ බැංකුව විවට වෙළඳපොළ කටයුතු හරහා දිගු කාලීන පදනමක් මත ද්‍රවශීලතාව ලබා දුන්නේය. තවද, ද්‍රවශීලතාව විශාල වශයෙන් අසමමිතික ලෙස ව්‍යාප්ත වී පැවතීම හේතුවෙන් බාධා වූ දේශීය මුදල් වෙළඳපොළෙහි කටයුතු ඉහළ නැංවීම සඳහා 2023 ජනවාරි මස මැද සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකුවේ නිත්‍ය පහසුකම් සඳහා වන ප්‍රවේශය සීමා කරමින් මහ බැංකුව විසින් නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලද අතර එමගින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිත්‍ය පහසුකම් මත අධික ලෙස රඳා පැවතීම අඩු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, දේශීය මුදල් වෙළඳපොළෙහි එක් දින ද්‍රවශීලතාව ඉහළ ගිය අතර අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ සහ ප්‍රතිමිලදී ගැනීමේ වෙළඳපොළ ක්‍රියාකාරකම් වර්ධනය විය. මෙම ප්‍රවණතා සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සඳහා වූ වැඩසටහන පිළිබඳ සාකච්ඡා අවසන් අදියරේ පැවතීම මත ආයෝජක අපේක්ෂා වර්ධනය වීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත එළදා අනුපාතික සහ අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් පහළ යෑම ආරම්භ වූ අතර එමගින් මුදල් තත්ත්වයන් යම් ප්‍රමාණයකට ලිහිල් කරමින් වෙළඳපොළ පොලී අනුපාතික අක්‍රමවත් ලෙස ඉහළ යෑම අඩු විය. මේ අතර, මහ බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලයේ උද්ධමන පුරෝකථනවල ඇතැම් වෙනස්කම් මධ්‍යයේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ පිළිබඳව අවසන් එකඟතාවයකට පැමිණීම සඳහා සියලු 'පූර්ව ක්‍රියාමාර්ග' සපුරාලීම සහ ඉදිරි කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් මූලික සාකච්ඡාවලදී තීරණය කළ ප්‍රමාණයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු අගයකින් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සඳහා 2023 වසරේ මාර්තු මාසය ආරම්භයේදී එකඟතාවයකට එළැඹුණි. ඒ අනුව, 2023 මාර්තු 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100කින් ඉහළ නංවන ලදී. මෙමගින් ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික අතර පරතරය තවදුරටත් අඩු කිරීමට උපකාරී වූ අතර,

7

ඉදිරි කාලය තුළදී රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රමෝපාය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලැබීමත් සමඟ වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑම අඛණ්ඩව සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එලෙස පොලී අනුපාතික ව්‍යුහය පහළ යෑම මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට අතිශය අභියෝගාත්මක ආර්ථික තත්ත්ව යටතේ සිය ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා පැවති පෙර නොවූ අන්දමේ පීඩන ලිහිල් කිරීමට උපකාරී වනු ඇති අතර ආර්ථික ක්‍රියාකාරකම් දැනටමත් පහළ මට්ටමක පවතින බැවින් උද්ධමන පීඩන ඉහළ නැංවිය හැකි මට්ටමේ මුදල් තත්ත්ව ලිහිල් කිරීමක් අපේක්ෂා නොකෙරේ.


**ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම උද්ධමන මට්ටම් මධ්‍යයේ මිල ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන මහ බැංකුවේ කැපවීම යළිත් අවධාරණය කරමින් 2022 වසරේ මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපායමාර්ගය වසර පුරා අඛණ්ඩව පවත්වාගෙන ගිය දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සමඟ අනුගත විය.** ඉහළ උද්ධමනයක් පවතින කාලයකදී, විශේෂයෙන්ම ආර්ථික කටයුතු පිළිබඳ මහජන විශ්වාසය නොමැති අවස්ථාවක මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය අතිශයින් අභියෝගාත්මක විය. ඇති විය හැකි අධි උද්ධමනය, දිගු කාලීන ආර්ථික අර්බුදය ආදිය පිළිබඳ කරුණු දක්වමින් උද්ධමනයේ සහ පොලී අනුපාතික දිශානතිය පිළිබඳ ඇතැම් විචාරකයින් විසින් සිදු කරන ලද අදූරදර්ශී සහ සාවද්‍ය ප්‍රකාශ මගින් මහජනතාව ව්‍යාකූලත්වයට පත් විය. 2022 අප්‍රේල් මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමත් සමඟ එලෙස පොලී අනුපාතික ඉහළ නැංවීමේ අවශ්‍යතාවය පිළිබඳව මහජනතාව දැනුම්වත් කරමින් අයහපත් විය හැකි උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සඳහා කාර්යක්ෂම මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයක් අවශ්‍ය විය. මහජනතාවට නිරන්තරයෙන් සහ පැහැදිලි ලෙස මුදල් ප්‍රතිපත්තිය සන්නිවේදනය කිරීමේ වැදගත්කම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ පැවති අවිනිශ්චිතතා හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත එළදා අනුපාතික ඇතුළු වෙළඳපොළ පොලී අනුපාතික අධික ලෙස ඉහළ යෑම වැනි කරුණු මගින් පිළිබිඹු වේ. සිය සන්නිවේදන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී මහ බැංකුව සාම්ප්‍රදායික ක්‍රමවේද මෙන්ම සමාජ මාධ්‍ය සහ ඩිජිටල් ක්‍රම ද අඛණ්ඩව භාවිතා කළේය. උද්ධමන ඉදිරි දැක්ම පිළිබඳ අවදානම් සහ අවිනිශ්චිතතා මධ්‍යයේ මුදල් ප්‍රතිපත්ති මාධ්‍ය නිවේදන හරහා නිසි පරිදි ප්‍රතිපත්ති සන්නිවේදනය අඛණ්ඩව සිදු කරන ලද අතර උද්ධමන ව්‍යාප්ති සටහන ප්‍රකාශයට පත් කිරීම මෙම වසර තුළදී නැවත ආරම්භ කරන ලදී. මෙම මුදල් ප්‍රතිපත්ති නිවේදන සමඟ මාධ්‍ය සාකච්ඡා ද පවත්වන ලද අතර එම සාකච්ඡා සමාජ මාධ්‍ය හරහා පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත සජීවීව විකාශනය කරන ලදී. උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සඳහා උද්ධමන ප්‍රවණතා පිළිබඳ මාසික මාධ්‍ය නිවේදන තුළද උද්ධමන ව්‍යාප්ති සටහන ප්‍රකාශයට පත් කිරීම මහ බැංකුව ආරම්භ කළේය. මීට අමතරව, මහ බැංකු අධිපතිවරයා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විවිධ සම්මුඛ සාකච්ඡා, සමුළු, සම්මන්ත්‍රණ, ආරාධිත දේශන සහ මංගත සම්මන්ත්‍රණ සඳහා සහභාගී වූ අතර එමගින් ප්‍රතිපත්ති සන්නිවේදනය ඉහළ නැංවීමට සහ ප්‍රතිපත්තිමය අරමුණු පිළිබඳ සාවද්‍ය වැටහීම් නිවැරදි කිරීමට උත්සාහ කළේය. මහ බැංකු වාර්ෂික වාර්තාව සහ මෑත කාලීන ආර්ථික ප්‍රවණතා ඇතුළු මහ බැංකුවේ නිත්‍ය ප්‍රකාශන, භාෂා ත්‍රිත්වයෙන්ම නියමිත කාලයට ප්‍රකාශයට පත් කරන ලද අතර සැප්තැම්බර් 15 වැනි දින වාර්තාව සහ මුදල් නීති පනතේ 64 සහ 68 වගන්ති යටතේ වාර්තා කිහිපයක් රජය වෙත ඉදිරිපත් කිරීමෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමට මහ බැංකුව රජයට සහාය විය. ඉදිරි කාලයේදී බලාත්මක කිරීමට නියමිත නව මහ බැංකු පනතට අනුව සිය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට මහ බැංකුව පියවර ගනු ඇති අතර වසරකට දෙවතාවක් මුදල් ප්‍රතිපත්ති වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම ආරම්භ වනු ඇත.

## 7.3 උද්ධමනයේ ප්‍රවණතා

**2022 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළදී මතුපිට උද්ධමනය ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම අගය දක්වා විශාල ලෙස ඉහළ ගිය අතර ඉන් පසුව පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය.** මතුපිට උද්ධමනය පෙර නොවූ අන්දමින් ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ආහාර මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හා සැපයුම් අංශයේ අවහිරතා, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ ඉන් පසුව බලශක්ති සහ ප්‍රවාහන මිල ගණන් වැනි පරිපාලිත මිල ගණන් වෙනස්වීම හා එමගින් අනෙකුත් අංශවලට ඇති කළ බලපෑම් මෙන්ම පසුගිය වසර කිහිපය තුළදී මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ පසු බලපෑම හේතුවෙන් සමස්ත ඉල්ලුම් පීඩන ඉහළ යෑම හේතු විය. කොළඹ පාරිභෝගික

7


**7.3 රූප සටහන**
**කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)**




(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 පෙබරවාරි මාසයේ සිට කො.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද අතර පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ කො.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව 2023 ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**7.4 රූප සටහන**
**ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)**




(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 ජනවාරි මාසයේ සිට ජා.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද අතර පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ ජා.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව 2023 ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.


මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන පරිදි ප්‍රවාහන අංශයේ උද්ධමනය 2022 වසරේ දෙවන භාගයේ සියයට 100කට වැඩි අගයක් වාර්තා කරමින් 2022 සැප්තැම්බර් මාසයේදී සියයට 150.4ක උපරිමයක් දක්වා ඉහළ ගිය අතර එම මාසයේදී ආහාර උද්ධමනය ද සියයට 94.9ක උපරිමයක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම තුළින් ඇති වූ පසු බලපෑම් හේතුවෙන් සමස්ත ඉල්ලුම් පීඩන අඩු වීම මෙන්ම ආහාර සහ බලශක්ති උද්ධමනය පහළ යෑම හේතුවෙන් 2022 වසරේ අවසාන කාලයේ සිට මතුපිට උද්ධමනය පහළ ගියේය. ඒ අනුව, කො.පා.මි.ද. (2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2021 වසර අවසානයේදී පැවති සියයට 12.1 සිට 2022 සැප්තැම්බර් මාසයේදී සියයට 69.8ක් දක්වා ඉහළ ගොස් 2022 වසර අවසානය වන විට සියයට 57.2ක් දක්වා පහළ ගියේය. කො.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2021 වසරේදී පැවති සියයට 6.0 සිට 2022 වසරේදී සියයට 46.4ක් දක්වා ඉහළ ගියේය. ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ද මීට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින් 2021 වසර අවසානයේ පැවති සියයට 14.0ට සාපේක්ෂව 2022 සැප්තැම්බර් මාසයේදී සියයට 73.7ක උපරිමයක් දක්වා ඉහළ ගොස් 2022 වසර අවසානය වන විට සියයට 59.2ක් දක්වා පහළ ගියේය. ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2021 වසරේදී පැවති සියයට 7.0ට සාපේක්ෂව 2022 වසරේදී සියයට 50.4ක් ලෙස වාර්තා විය. 2022 ඔක්තෝබර් මාසයේ සිට ආරම්භ වූ උද්ධමනය පහළ යෑම 2023 වසරේ මුල් කාලයේදී ද අඛණ්ඩව පැවතුණි. වෙනස් වන වියදම් රටාවන් සහ වෙළඳපොළෙහි පවතින භාණ්ඩ හා සේවා වෙනස්වීම් සලකා බැලීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද. යන දර්ශකවල පදනම් වර්ෂය 2013 සිට 2021 දක්වා සංශෝධනය කරන ලදී. කෙසේ වෙතත්, පදනම් වර්ෂයේ සංශෝධනයක් සිදු වුවද මෙම දර්ශක ද්විත්වයෙන්ම මනිනු ලබන උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාව සමස්තයක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. ඒ අනුව, කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2023 පෙබරවාරි මාසයේදී සියයට 50.6ක් දක්වා අඩු වූ අතර ජා.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2023 පෙබරවාරි මාසයේදී සියයට 53.6ක අගයක් වාර්තා කළේය.

7

**යටිදැරි ඉල්ලුම් පීඩන පිළිබිඹු කරමින් මූලික උද්ධමනය ද 2022 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළදී ඉහළ ගිය අතර ඉන් පසුව මතුපිට උද්ධමනයට සාපේක්ෂව අඩු වේගයකින් පහළ ගියේය.** මූලික උද්ධමනය ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් පසුගිය කාලයේ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ පසු බලපෑම හේතුවෙන් ඇති වූ ඉල්ලුම ඉහළ යෑම, ආනයනික භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම මෙන්ම ආපනශාලා සහ හෝටල්, සෞඛ්‍යය, අධ්‍යාපනය වැනි ආහාර නොවන කාණ්ඩවල පිරිවැය ඉහළ යෑම හේතු විය. කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද. යන දර්ශක දෙක මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේදී උපරිම මට්ටම් දක්වා ඉහළ ගොස් ඉන් පසුව පහළ ගියේය. නිතර මිල උච්චාවචන සහිත ආහාර සහ බලශක්ති අයිතමයන්ගේ මිල ගණන් පහළ යෑම මතුපිට උද්ධමනය පහළ යෑම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑ අතර එම අයිතමයන් මූලික උද්ධමනය මැනීමේදී ඇතුළත් නොවීම හේතුවෙන් මතුපිට උද්ධමනයට සාපේක්ෂව මූලික උද්ධමනය අඩු වේගයකින් පහළ ගියේය. මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුම අඩු වීම මූලික උද්ධමනය පහළ යෑම සඳහා බලපෑ ප්‍රධාන සාධකය විය. කො.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2021 වසර අවසානයේ පැවති සියයට 8.3 සිට 2022 සැප්තැම්බර් මාසයේදී සියයට 50.2ක් දක්වා ඉහළ ගොස් 2022 වසර අවසානය වන විට සියයට 47.7ක් දක්වා පහළ ගියේය. කො.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2021 වසරේදී වාර්තා වූ සියයට 4.4ට සාපේක්ෂව 2022 වසරේදී සියයට 34.6ක් විය. ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය ද 2021 වසර අවසානයේ පැවති සියයට 10.8 සිට 2022 සැප්තැම්බර් මාසයේදී සියයට 64.1ක් දක්වා ඉහළ ගිය අතර 2022 වසර අවසානය වන විට සියයට 57.5ක් දක්වා පහළ ගියේය. ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2021 වසරේදී පැවති සියයට 5.5ට සාපේක්ෂව 2022 වසරේදී සියයට 43.9ක් ලෙස වාර්තා විය. මතුපිට උද්ධමනයට සමාන අන්දමින් මූලික උද්ධමනය ද 2023 වසරේ මුල් කාලය තුළදී අඛණ්ඩව පහළ ගිය අතර කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2023 පෙබරවාරි මාසයේදී සියයට 43.6ක් දක්වා පහළ ගියේය. ජා.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2023 පෙබරවාරි මාසයේදී සියයට 50.1ක් දක්වා පහළ ගියේය.

### 7.5 රූප සටහන
### මූලික උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)




(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම, පිළිවෙළින්, 2023 ජනවාරි සහ පෙබරවාරි මාසවල දත්ත නිකුත් කිරීමේ සිට ආරම්භ කරන ලද අතර පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව, 2023 ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**උද්ධමන අපේක්ෂා ඉහළ මට්ටමක පැවතියද සමස්තයක් ලෙස ප්‍රකාශිත උද්ධමනයෙහි ප්‍රවණතාවය අනුගමනය කළේය.** බොහෝ දුරට ප්‍රකාශිත උද්ධමනය අනුගමනය කරන ආයතනික සහ කුටුම්භ යන අංශ

### 7.2 සංඛ්‍යා සටහන
### උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)

සියයට

| | | 2013=100 | | | | | | 2021=100 | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | දෙසැ.-17 | දෙසැ.-18 | දෙසැ.-19 | දෙසැ.-20 | දෙසැ.-21 | දෙසැ.-22 | ජන.-23 | පෙබ.-23 |
| මතුපිට උද්ධමනය | **කො.පා.මි.ද.** | **7.1** | **2.8** | **4.8** | **4.2** | **12.1** | **57.2** | **51.7** | **50.6** |
| | ආහාර උද්ධමනය | 14.4 | -1.5 | 6.3 | 9.2 | 22.1 | 64.4 | 60.0 | 54.4 |
| | ආහාර නොවන උද්ධමනය | 4.2 | 4.8 | 4.3 | 2.0 | 7.5 | 53.4 | 47.9 | 48.8 |
| | **ජා.පා.මි.ද.** | **7.3** | **0.4** | **6.2** | **4.6** | **14.0** | **59.2** | **53.2** | **53.6** |
| | ආහාර උද්ධමනය | 12.8 | -4.5 | 8.6 | 7.5 | 21.5 | 59.3 | 53.6 | 49.0 |
| | ආහාර නොවන උද්ධමනය | 2.9 | 4.7 | 4.2 | 2.2 | 7.6 | 59.0 | 52.9 | 57.4 |
| මූලික උද්ධමනය | කො.පා.මි.ද. | **4.3** | **3.1** | **4.8** | **3.5** | **8.3** | **47.7** | **45.6** | **43.6** |
| | ජා.පා.මි.ද. | **2.7** | **3.1** | **5.2** | **4.7** | **10.8** | **57.5** | **52.0** | **50.1** |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දෙකෙහි නුදුරු කාලීන උද්ධමන අපේක්ෂා 2022 වසරේදී සමස්තයක් ලෙස සමාන අගයන් ගන්නා ලදී. උද්ධමනය පහළ යෑමට අනුකූලව මෑත මාසවලදී සියලුම කාල සීමාවන් සඳහා උද්ධමන අපේක්ෂා පහළ යෑමක් දක්නට ලැබුණි. මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයට අනුව ඉදිරි කාලය තුළදී උද්ධමනය පහළ යෑම සඳහා දේශීය සැපයුම් තත්ත්වයන්හි අපේක්ෂිත වර්ධනයන්, ආනයන සීමා ලිහිල් කිරීම, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන්වල අපේක්ෂිත පහළ යෑම, ආදායම් මට්ටම් අඩු වීම සහ දැඩි මුදල් තත්ත්ව හේතු වනු ඇත.

## 7.4 පොලී අනුපාතිකවල හැසිරීම


### වෙළඳපොළ ද්‍රවශීලතාව සහ කෙටි කාලීන පොලී අනුපාතික

**2022 වසරේ පළමු භාගය තුළදී දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව විශාල හිඟ මට්ටමක පැවති අතර වසර අවසානය වන විට ද්‍රවශීලතාව ක්‍රමයෙන් වර්ධනය විය.** 2021 සැප්තැම්බර් මාසයේදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ නැංවීම හේතුවෙන් සෘණ මට්ටම් දක්වා අඩු වූ දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, ඉහළ උද්ධමනය මධ්‍යයේ දැඩි මුදල් තත්ත්ව පවත්වා ගැනීමේ අවශ්‍යතාවය පිළිබිඹු කරමින් සෘණ මට්ටම්වල පැවතීමට ඉඩ සලසන ලදී. මුදල් වෙළඳපොළෙහි මෙවැනි විශාල සෘණ ද්‍රවශීලතාවක් සඳහා හේතු වූ අනෙකුත් ප්‍රධාන සාධක අතර අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා පහසුකම් සැලසීමට මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත විදේශ විනිමය විකිණීම, දළ නිල සංචිත යොදා ගනිමින් ශුද්ධ පදනම මත රජයේ විදේශීය ණය ආපසු ගෙවීම්, බැංකු පද්ධතිය වෙතින් මහජනතාව ශුද්ධ පදනම මත මුදල් ආපසු ගැනීම් සහ දේශීය බැංකු සමඟ පැවති ගැනුම්-විකුණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් කල්පිරීම යනාදිය විය. 2022 මැයි මාසයේ සිට දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ක්‍රමයෙන් වර්ධනය වීමට බලපෑ සාධක අතර මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලදී ගැනීම, ඉහළ තැන්පතු පොලී අනුපාතික හේතුවෙන් බැංකු පද්ධතිය වෙත වූ ව්‍යවහාර මුදල් තැන්පතු ඉහළ යෑම සහ ඇතැම් බැංකුවල පැවති සැලකිය යුතු ද්‍රවශීලතා හිඟය අවම කිරීම සඳහා දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම යනාදිය විය. ඒ අනුව, දේශීය මුදල් වෙළඳපොළ දෛනික ද්‍රවශීලතා හිඟයෙහි සාමාන්‍යය, 2022 වසරේ පළමු භාගය තුළදී වාර්තා වූ රුපියල් බිලියන 531 හා සැසඳීමේදී 2022 වසරේ අවසාන කාර්තුව තුළ රුපියල් බිලියන 279ක් පමණ විය. කෙසේ වෙතත්, මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා ව්‍යාප්තිය විශාල ලෙස අසමමිතිකව පැවතිණි. ඇතැම් දේශීය බැංකු, විශේෂයෙන්ම රජය සතු වාණිජ බැංකු රජය සහ රජය සතු වාණිජ ව්‍යාපාර සමඟ සිදු කළ ගනුදෙනු පිළිබිඹු කරමින් සැලකිය යුතු ද්‍රවශීලතා හිඟයක් වාර්තා කළේය. මේ අතර, විදේශීය බැංකු රජය වෙත ඇති නිරාවරණය සම්බන්ධයෙන් වූ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ ගැටලු පිළිබිඹු කරමින් විශාල ද්‍රවශීලතා අතිරික්ත පවත්වාගෙන ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, බලපත්‍රලාභී වාණිජ බැංකු කිහිපයක් අන්තර් බැංකු වෙළඳපොළ තුළ ගනුදෙනු සිදු නොකර මහ බැංකුවේ නිත්‍ය පහසුකම් මත අඛණ්ඩව රඳා පැවතුණි. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවල එක් දින ද්‍රවශීලතා හා සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීමේ අදහසින් 2023 ජනවාරි මස මැද සිට බලපැවැත්වෙන පරිදි වාණිජ බැංකු සඳහා නිත්‍ය පහසුකම් භාවිතය සීමා කිරීමට මහ බැංකුව තීරණය කළේය.[1] මෙම නියාමන ක්‍රියාමාර්ගය මෙන්ම මීට සමගාමීව ද්‍රවශීලතා අවශ්‍යතාවය ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ද්‍රවශීලතාව සැපයීමට දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම සහ අනෙකුත් ද්‍රවශීලතා පහසුකම් ලබා දීම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාවයේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණු අතර මාස 16කට පසු 2023 ජනවාරි මස මැද වනවිට ද්‍රවශීලතාව අතිරික්ත මට්ටමක් වාර්තා කළේය. ඉන් පසුව ප්‍රධාන වශයෙන් ද්‍රවශීලතා අතිරික්ත සහිත බැංකු විසින් නිත්‍ය තැන්පතු පහසුකම භාවිත කරන ආකාරය අනුව දේශීය මුදල් වෙළඳපොළෙහි එක් දින ද්‍රවශීලතාව උච්චාවචනය විය. මේ අතර, මූලික වශයෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව වර්ධනය වීම හේතුවෙන් මහ බැංකුව විසින් විදේශ විනිමය සැපයීම පහළ යෑම සහ මහ බැංකුව විසින් විශේෂයෙන්ම 2023 වසරේ මේ දක්වා කාලය තුළදී විදේශ විනිමය ශුද්ධ පදනමින් මිලදී ගැනීම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළෙහි රුපියල් ද්‍රවශීලතාව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, 2023 වසරේ පළමු කාර්තුව තුළදී එක් දින ද්‍රවශීලතා හිඟයෙහි සාමාන්‍යය රුපියල් බිලියන 72ක් පමණ දක්වා අඩු විය.

1 2023 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම (බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සිය අතිරික්ත ද්‍රවශීලතාව තැන්පත් කිරීමට සහ පොලී ආදායමක් උපයා ගැනීම සඳහා වන එක් දින තැන්පතු පහසුකම) දින දර්ශිත මසකට උපරිම අවස්ථා පහක් දක්වා සීමා කරන ලදී. ඒ අතරම, දිනය අවසානයේදී මහ බැංකුව හරහා සිය හිඟ ද්‍රවශීලතා අවශ්‍යතා තවදුරටත් සපුරා ගැනීමට බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා සුරැකුම් මත ලබා දෙන නිත්‍ය ණය පහසුකම ද අදාළ දිනකදී බලපත්‍රලාභී වාණිජ බැංකුවක ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයෙන් සියයට 90ක් දක්වා සීමා කෙරිණි.

**දැඩි ද්‍රවශීලතා තත්ත්වයට සහ දැඩි මුදල් ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යැමට ප්‍රතිචාර වශයෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව ආසන්නයේ පැවතුණි.** 2022 වසර ආරම්භයේදී නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාවට ආසන්නයෙන් පැවති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය බැංකු පද්ධතියේ අඛණ්ඩව පැවති විශාල ද්‍රවශීලතා හිඟය හේතුවෙන් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව කරා ළඟා විය. 2022 අප්‍රේල් මාසයේ සිට අන්තර් බැංකු මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් ක්‍රමයෙන් අඩු වීමක් දක්නට ලැබුණු අතර 2022 ජූලි මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීමෙන් පසුව අන්තර් බැංකු මුදල් වෙළඳපොළ බොහෝ දුරට අක්‍රීයව පැවතුණි. අසමමිතික ද්‍රවශීලතා ව්‍යාප්තිය සහ විදේශීය බැංකුවල ආයතනික වශයෙන් පවතින සීමා වැනි විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ ගැටලු මධ්‍යයේ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් වූ වෙළඳපොළ අවිනිශ්චිතතා අන්තර් බැංකු වෙළඳපොළෙහි දුර්වල ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි නිතිපතා පැවැත්වීම මෙන්ම නිත්‍ය පහසුකම් භාවිතයට සීමා පැනවීම වැනි මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් අන්තර් බැංකු මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් ක්‍රමයෙන් වර්ධනය වීමක් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 ජනවාරි මස මැද සිට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාවේ සිට සුළු වශයෙන් පහළ යැමක් වාර්තා කළේය. ඒ අනුව, 2022 වසරේදී සමස්තයක් ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතික ප්‍රතිශතාංක 9.50කින් ඉහළ යැමට ප්‍රතිචාර වශයෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 2022 වසරේදී ප්‍රතිශතාංක 9.55කින් ඉහළ ගියේය. මේ අතර, 2023 මාර්තු මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100කින් ඉහළ නැංවීමත් සමඟ 2023 මාර්තු 07 වන විට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සියයට 16.46ක් දක්වා ඉහළ ගොස් 2023 මාර්තු මස අවසානය වන විට නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව ආසන්නයෙන් පැවතුණි.

**7.6 රූප සටහන**
**දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (අ)**





(අ) අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ අක්‍රීයව පැවති දින සඳහා බරිත සාමාන්‍යය ඒක්ෂණ මුදල් අනුපාතිකයන් වාර්තා නොවේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

### රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික

**දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධ අවිනිශ්චිතතා සහ රජයේ ඉහළ ණය ගැනීමේ අවශ්‍යතාවය මධ්‍යයේ රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් පවතින ඉහළ අවදානම් පිළිබිඹු කරමින් මෙන්ම මිල පීඩන අඛණ්ඩව ඉහළ යැම පාලනය කිරීම සඳහා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම හේතුවෙන් 2022 වසරේදී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** විදේශීය මූල්‍යන සඳහා ප්‍රවේශය සීමා වීම සමඟ දේශීය වෙළඳපොළ මූල්‍යන මත රජය අඛණ්ඩව යොමු වීම සහ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ අවිනිශ්චිතතා ඉහළ යැම හේතුවෙන් වෙළඳපොළ අපේක්ෂා අයහපත් වූ බැවින් 2022 වසරේදී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික අතර විශාල පරතරයක් දක්නට ලැබුණු අතර රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකවල හැසිරීම හා සමගාමීව අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික අඛණ්ඩව ඉහළ ගියේය. 2022 වසරේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ප්‍රතිශතාංක 9.50කින් ඉහළ නැංවීමට සාපේක්ෂව සියලු කල්පිරීම්වල ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික වසර තුළදී ඒවායේ උපරිම මට්ටම් දක්වා ප්‍රතිශතාංක 22.30-25.00කින් පමණ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම සම්බන්ධයෙන් අවසන් එකඟතාවයකට එළඹීමේ අපේක්ෂා සමඟ ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය වූ බැවින් 2022 වසර අවසානයේ සහ 2023 වසර මුල් කාලයේදී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස පහළ යැමක් දක්නට ලැබුණි. නිත්‍ය පහසුකම් මත

**7.7 රූප සටහන**
**භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික (අ)**





(අ) ලංසු පිළිගත නොහැකි වීම හෝ අදාළ පරිණත කාලය සඳහා සුරැකුම්පත් නිකුතු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඇතැම් සති සඳහා ඵලදා අනුපාතික වාර්තා නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සීමා පැනවීම සහ දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි හරහා ද්‍රවශීලතාව සැපයීම මෙන්ම අනෙකුත් ද්‍රවශීලතා සැපයීමේ පහසුකම් ඇතුළු මහ බැංකුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්ව වර්ධනය වීම රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික පහළ යෑම සඳහා සහාය විය. ඒ අනුව, දින 364ක කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික 2022 සැප්තැම්බර් මාසය ආරම්භයේදී එහි උපරිමයක් වාර්තා කළ අතර, දින 91 සහ දින 182 කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික 2022 නොවැම්බර් මස මැදදී උපරිම අගයක් වාර්තා කළේය. ඒ අනුව, සියලුම කල්පිරීම්වල භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික ඒවායේ උපරිම මට්ටම්වල සිට 2023 පෙබරවාරි මස අවසානය වන විට ප්‍රතිශතාංක 2.80-3.90කින් පමණ

**7.8 රූප සටහන**
**රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


අඩු විය. සමස්තයක් ලෙස භාණ්ඩාගාර බිල්පත් සඳහා වන වෙළඳපොළ කැමැත්ත නොවෙනස්ව පැවතිය ද දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ අවිනිශ්චිතතා හේතුවෙන් කෙටි පරිණත කාල සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා වන වෙළඳපොළ කැමැත්ත ඉහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, වෙළඳපොළ අපේක්ෂා ඉහළ යෑම හේතුවෙන් 2022 වසර අවසානයේදී සහ 2023 වසර මුල් කාලයේදී සියලුම කල්පිරීම්වල භාණ්ඩාගාර බිල්පත් සඳහා වන කැමැත්ත ක්‍රමානුකූලව වර්ධනය විය. ඒ හා සමාන ප්‍රවණතාවක් අනුගමනය කරමින්, සියලු කල්පිරීම්වල ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාර බැඳුම්කර මත ඵලදා අනුපාතික 2022 ජනවාරි සිට නොවැම්බර් මස මැද දක්වා කාල සීමාව තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ඉන් පසුව පහළ යෑමක් දක්නට ලැබුණි. භාණ්ඩාගාර බිල්පත් මෙන් නොව ඉහළ ඵලදා අනුපාතිකයක් සහිත දිගු කාලීන භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන වෙළඳපොළ කැමැත්ත වැඩි විය. ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතිකවලට සමගාමීව ද්විතීයික වෙළඳපොළ රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළ ද ප්‍රාථමික වෙළඳපොළ තුළ නිරීක්ෂණය වූ ප්‍රවණතා අනුගමනය කරමින් රජයේ සුරැකුම්පත් මත ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික ඉන් පසුව අඩු විය.

### තැන්පතු සහ ණය පොලී අනුපාතික

**මහ බැංකුව විසින් ගනු ලැබූ දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම සහ දේශීය මුදල් වෙළඳපොළෙහි හිඟ ද්‍රවශීලතා තත්ත්වයන් පිළිබිඹු කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පිරිනමනු ලබන තැන්පතු පොලී අනුපාතික 2022 වසරේදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම, රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් පවතින අවදානම් වැඩි වීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඉහළ යෑම සහ දේශීය මුදල් වෙළඳපොළෙහි විශාල හිඟ ද්‍රවශීලතාවක් අඛණ්ඩව පැවතීමත් සමඟ පවතින තැන්පතු රඳවා තබා ගැනීමට සහ නව තැන්පතු ප්‍රවර්ධනය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු අතර තරගකාරිත්වය ඉහළ යෑම හේතුවෙන් තැන්පතු පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දේශීය මුදල් වෙළඳපොළෙහි සැලකිය යුතු ද්‍රවශීලතා හිඟයක් පැවතීම මධ්‍යයේ බැංකු විසින් ඉහළ පොලී අනුපාතික සහිත විශේෂයෙන් කෙටි කාලීන පරිණත කාල සඳහා නව තැන්පතු

7

**7.9 රූප සටහන**
**තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

උපකරණ හඳුන්වා දෙන ලදී. තවද, රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික විශාල ලෙස ඉහළ යෑම තැන්පතු පොලී අනුපාතික ඉහළ යෑම සඳහා හේතු විය. මෙම ප්‍රවණතාවලට අනුව, බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR)[2] 1991 වසර අවසානයේ සිට මෙතෙක් වාර්තා වූ ඉහළම මට්ටම වාර්තා කරමින් 2022 දෙසැම්බර් මාසය අවසානය වන විට සියයට 14.06ක් විය. බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය ද (AWFDR)[3] මීට සමාන ප්‍රවණතාවක් අනුගමනය කළේය. තවද, බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR)[4] සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR),[5] 2022 නොවැම්බර් මාසයේදී ඉතිහාසයේ මෙතෙක් පැවති ඉහළම මට්ටම් වාර්තා කරමින්, පිළිවෙළින්, සියයට 23.63ක් සහ සියයට 24.05ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, 2022 වසර තුළදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ප්‍රතිශතාංක 9.50කින් වැඩි වීමට සමානුපාතික නොවන ලෙස බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය මගින් ගණනය කරනු ලබන නව තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික 2022 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළදී ප්‍රතිශතාංක 17කින් පමණ ඉහළ ගියේය. 2022 වසරේදී වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික විශාල ලෙස ඉහළ යෑම සහ එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොළ ණය පොලී අනුපාතික කෙරෙහි ඇති වූ බලපෑම සැලකිල්ලට ගනිමින්, විශේෂයෙන්ම 2022 වසර අග භාගයේදී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව වැඩිදියුණු කිරීමට පියවර ගන්නා අතරම තැන්පතු රැස් කිරීමේ අහිතකර තරගකාරිත්වය ඉවත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව මහ බැංකුව බලපත්‍රලාභී බැංකුවලට අවධාරණය කළේය. ඒ අනුව, 2022 වසර අවසානය වන විට ද්‍රවශීලතා තත්ත්වයන් වර්ධනය වීමේ බලපෑම පිළිබිඹු කරමින්, වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික පහළ යෑම ආරම්භ විය. තවද, 2023 වසරේ මුල් භාගයේදී අන්තර් බැංකු වෙළඳපොළ සක්‍රීය කිරීම සඳහා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය කිරීමට උපකාරී විය. මෙම ක්‍රියාමාර්ග සහ විශේෂයෙන්ම 2023 ජනවාරි මාසයේ සිට රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන් තැන්පතු පොලී අනුපාතික පහත වැටීමේ ප්‍රවණතාවය ඉදිරි කාල සීමාව තුළදී අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**දැඩි මුදල් හා ද්‍රවශීලතා තත්ත්වයන්ට ප්‍රතිචාර දක්වමින් 2022 වසර තුළදී වෙළඳපොළ ණය පොලී අනුපාතික ද සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ඇතැම් ණය පොලී අනුපාතික 2022 වසර අවසානය වන විට පහළ යෑම ආරම්භ විය.** මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික පෙර නොවූ අන්දමින් ඉහළ නැංවීම, දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති සැලකිය යුතු ද්‍රවශීලතා හිඟය සහ එමගින් තැන්පතු පොලී අනුපාතික ඉහළ යෑම, ආර්ථික ක්‍රියාකාරකම් සංකෝචනය වීම මධ්‍යයේ ණය අවදානම ඉහළ යෑම සහ රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික විශාල ලෙස ඉහළ යෑම 2022 වසරේදී වෙළඳපොළ ණය පොලී අනුපාතික ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඇතැම් වෙළඳපොළ ණය පොලී අනුපාතික 2022 වසරේදී මෙතෙක් වාර්තා කළ ඉහළම මට්ටම් වාර්තා කළේය. 2022 වසර අවසානය වන විට බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR)[6] සියයට 18.70ක් දක්වා ප්‍රතිශතාංක 9කින් පමණ 2021 වසර අවසානයට සාපේක්ෂව ඉහළ ගිය අතර බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR)[7] ප්‍රතිශතාංක 17කින් පමණ ඉහළ යමින්

2 බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

3 බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන කාලීන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

4 බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය, මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති සියලුම පොලී උපයන නව රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

5 බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය, මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති සියලුම පොලී උපයන නව කාලීන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

6 බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද සියලුම රුපියල් ණය සහ අත්තිකාරම්වලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

7 බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය, මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද නව රුපියල් ණය සහ අත්තිකාරම්වලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

## 7.3 සංඛ්‍යා සටහන
## පොලී අනුපාතිකවල හැසිරීම

වාර්ෂික පොලී අනුපාතිකය සියයට

| පොලී අනුපාතිකය | 2021 අවසානයට | 2022 අවසානයට | ප්‍රතිශතාංක වෙනස |
|---|---|---|---|
| **ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 5.00 | 14.50 | 9.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 6.00 | 15.50 | 9.50 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය** | 5.95 | 15.50 | 9.55 |
| **රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික** | | | |
| ප්‍රාථමික වෙළෙඳපොළ (අ) | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | | |
| දින 91 | 8.16 | 32.64 | 24.48 |
| දින 182 | 8.33 | 32.20 | 23.87 |
| දින 364 | 8.24 | 29.27 | 21.03 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | | |
| වසර 2 | 9.16(ආ) | 33.01(ඇ) | 23.85 |
| වසර 3 | 9.70(ආ) | 31.36(ඇ) | 21.66 |
| වසර 4 | 8.55(ආ) | - | - |
| වසර 5 | 11.14(ආ) | 31.78(ඇ) | 20.64 |
| වසර 10 | 8.86(ආ) | 30.86(ඇ) | 22.00 |
| ද්විතීයික වෙළෙඳපොළ | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | | |
| දින 91 | 7.77 | 30.75 | 22.98 |
| දින 182 | 8.07 | 29.50 | 21.43 |
| දින 364 | 8.22 | 28.39 | 20.17 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | | |
| වසර 2 | 8.58 | 28.19 | 19.61 |
| වසර 3 | 9.55 | 28.32 | 18.77 |
| වසර 4 | 10.38 | 27.60 | 17.22 |
| වසර 5 | 10.66 | 26.78 | 16.12 |
| වසර 10 | 11.71 | 26.18 | 14.47 |
| **තැන්පතු පොලී අනුපාතික** | | | |
| බලපත්‍රලාභී වාණිජ බැංකු (ඈ) | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.05-6.35 | 0.25-6.00 | - |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු (ඉ) | 0.15-15.00 | 4.50-30.00 | - |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (ඊ) | 4.94 | 14.06 | 9.12 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඊ) | 5.94 | 18.49 | 12.55 |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (ඊ) | 6.45 | 23.07 | 16.62 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඊ) | 6.67 | 23.73 | 17.06 |
| අනෙකුත් මූල්‍ය ආයතන (උ) | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.50 | 3.00 | -0.50 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 5.50 | 12.00 | 6.50 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් (ඌ) | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.46-4.69(එ) | 4.63-8.03 | - |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 9.02-10.13 | 20.48-27.15 | - |
| **ණය පොලී අනුපාතික** | | | |
| බලපත්‍රලාභී බැංකු (ඒ) | | | |
| බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය | 10.49 | 20.73 | 10.24 |
| බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය | 10.04 | 26.91 | 16.87 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු (ඈ) | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (මාසික) | 8.33 | 28.19 | 19.86 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය | 9.87 | 18.70 | 8.83 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය | 9.48 | 26.20 | 16.72 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 7.50-11.50 | 28.00-32.00 | - |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (ඔ) | 7.50-12.50 | 18.00-27.25 | - |
| බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (ඌ) | | | |
| මූල්‍ය කල්බදු | 12.77-28.33 | 21.53-35.37 | - |
| කුලිපිට ගැනුම් | 11.08-27.00 | 16.94-38.28 | - |
| නිශ්චල දේපළ මත ලබා දුන් ණය | 15.29-16.77(එ) | 26.80-28.43 | - |
| විදේශ විනිමය තැන්පතු මත පොලී අනුපාතික (ඕ) | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු - එ.ජ.ඩොලර් | 0.03-4.60 | 0.10-7.77 | - |
| ඉතිරිකිරීමේ තැන්පතු - ස්ටර්ලින් පවුම් | 0.03-3.00 | 0.20-4.83 | - |
| කාලීන තැන්පතු - එ.ජ.ඩොලර් | 0.02-7.00 | 0.02-11.50 | - |
| කාලීන තැන්පතු - ස්ටර්ලින් පවුම් | 0.02-5.75 | 0.02-7.00 | - |
| **සාංගමික ණය වෙළෙඳපොළ** | | | |
| ණයකර | 8.00-12.00 | 15.42-28.00 | - |
| වාණිජ පත්‍රිකා | 6.00-12.00 | 11.00-36.00 | - |

(අ) ආසන්නතම වෙන්දේසියේදී නිකුත් කළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික

(ආ) 2021 වසරේදී අවසාන ප්‍රාථමික වෙන්දේසිය
වසර 2 - නොවැ. 11; වසර 3 - දෙසැ. 13; වසර 4 - අගෝ. 30;
වසර 5 - ඔක්. 12; වසර 10 - ජූලි 29

(ඇ) 2022 වසරේදී අවසාන ප්‍රාථමික වෙන්දේසිය
වසර 2 - දෙසැ. 13; වසර 3 - දෙසැ. 29;
වසර 5 - ඔක්. 28; වසර 10 - නොවැ. 11

(ඈ) වාණිජ බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.

(ඉ) ඇතැම් වාණිජ බැංකු විසින් සැපයූ විශේෂ පොලී අනුපාතික මෙහි උපරිම පොලී අනුපාතිකය වේ.

(ඊ) රජයේ අනුමැතිය මත ලබා දෙන සියයට 15ක් වූ ජ්‍යෙෂ්ඨ පුරවැසි විශේෂ ස්ථාවර තැන්පතු අනුපාතිකයෙහි බලපෑම ඉවත් කිරීම සඳහා 2018 වසරේ ජූලි මස සිට බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කරනු ලබන්නේ අදාළ වෙළෙඳපොළ පොලී අනුපාතික මගිනි. 2018 ජූනි මස සිට බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කිරීම සඳහා මෙම ක්‍රමය භාවිතා වේ.

(උ) තෝරාගත් අනෙකුත් මූල්‍ය ආයතන විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.

(ඌ) පොලී අනුපාතික පරාසයන් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අදාළ මාසයේදී තැන්පතු ලබා ගැනීම සහ ණය ලබා දීම සඳහා ඉදිරිපත් කරනු ලබන උපරිම සහ අවම සාමාන්‍ය පොලී අනුපාතික මත පදනම් වේ. 2022 වසර සඳහා දත්ත තාවකාලික වේ.

(එ) සංශෝධිත

(ඒ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.

(ඔ) නිවාස කටයුතු සඳහා දෙන ලද ණය පමණි.

(ඕ) පොලී අනුපාතික පරාසයන් බලපත්‍රලාභී වාණිජ බැංකු හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සපයන ලද උපරිම හා අවම පොලී අනුපාතික මත පදනම් වේ.

මූලයන්: අදාළ මූල්‍ය ආයතන
කොළඹ කොටස් හුවමාරුව
ශ්‍රී ලංකා මහ බැංකුව


2022 වසර අවසානයේදී සියයට 26.20ක් ලෙස ඉතිහාසයේ මෙතෙක් වාර්තා කළ ඉහළම අගය වාර්තා කළේය. මේ අතර, ප්‍රධාන ගනුදෙනුකරුවන් සඳහා ණය ලබා දීමේ අනුපාතිකය වන මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR),[8] අනෙකුත් ණය පොලී අනුපාතිකවල ඉහළ යෑම් අබිබවා යමින් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකවල සිදු වූ විශාල වෙනස්වීම් අනුගමනය කළ අතර 2022 නොවැම්බර් මාසයේදී සියයට 28.25ක උපරිමයක් දක්වා ඉහළ ගියේය. දැඩි මුදල් තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, ණය කාඩ්පත් අත්තිකාරම්, පෙර ගිවිසගෙන ඇති තාවකාලික බැංකු අයිරා සහ උකස් අත්තිකාරම් සඳහා පනවා තිබූ උපරිම පොලී අනුපාතික 2022 අප්‍රේල් මාසයේදී ඉවත් කරන ලද අතර, එමගින් අනෙකුත් වෙළෙඳපොළ ණය පොලී අනුපාතික වෙනස්වීම්වලට අනුකූලව එම ණය උපකරණ සඳහා අදාළ පොලී අනුපාතික ද ඉහළ යෑමට ඉඩ සලසන ලදී. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණය[9] මගින් මනිනු ලබන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් ණය සඳහා වූ පොලී අනුපාතික වැඩි ණය අවදානම් ආන්තිකයක් සහිතව බලපත්‍රලාභී වාණිජ බැංකුවල සමස්ත ණය පොලී අනුපාතික වැඩි වීමේ ප්‍රවණතාව බොහෝ දුරට

8 බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය, සතියක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය ප්‍රධාන ගනුදෙනුකරුවන්ට ලබා දුන් කෙටි කාලීන රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා වන පොලී අනුපාතික මත පදනම් වේ.

9 වාර්ෂික පිරිවැටුප රුපියල් බිලියන 1කට නොවැඩි සහ සේවකයන් 300කට අඩු සංඛ්‍යාවක් සේවා නියුක්ත ව්‍යාපාර, මාසික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණය උදෙසා සලකා බලන ලෙස බැංකුවලින් ඉල්ලා සිටින ලදී.

7

**7.10 රූප සටහන**
**සුරැකුම් වර්ගය අනුව බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතික (%)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනුගමනය කළේය. ඒ අනුව, 2022 වසර තුළදී බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය (AWSR)[10] සහ බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය (AWNSR),[11] පිළිවෙළින්, ප්‍රතිශතාංක 10කින් සහ ප්‍රතිශතාංක 17කින් පමණ ඉහළ ගියේය. කෙසේ වෙතත්, වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වීම සහ 2022 වසර අවසානය වන විට රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් ඇතැම් වෙළඳපොළ ණය පොලී අනුපාතික 2022 වසර අවසානය වන විට පහළ යෑමේ සලකුණු පෙන්නුම් කළේය. විශේෂයෙන්ම, 2023 ජනවාරි සිට පෙබරවාරි දක්වා කාලය තුළදී මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය පදනම් අංක 348කින් අඩු විය. අනෙකුත් වෙළඳපොළ ණය පොලී අනුපාතික ද ඉදිරි කාලය තුළදී පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**සෑම වසරක් අවසානයේදීම රජයේ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරනු ලබන නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය,[12] 2022 වසර සඳහා වූ සියයට 7.48 හා සැසඳීමේදී 2023 වසර සඳහා සියයට 16.97ක් ලෙස මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.** පවතින වෙළඳපොළ පොලී අනුපාතික පිළිබිඹු කිරීමේ අදහසින්, 2023 වසර සඳහා නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය, දෙසැම්බර් මාසයට පෙර මාස හය තුළ (එනම්, 2022 වසරේ ජූනි සිට නොවැම්බර් දක්වා කාලය සඳහා) බලපත්‍රලාභී වාණිජ බැංකුවල මාසික බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකවල සරල සාමාන්‍යය මත පදනම්ව ගණනය කර ඇත.[13]

## විදේශ විනිමය තැන්පතු මත වන පොලී අනුපාතික

**ගෝලීය මූල්‍ය තත්ත්වයන් දැඩි වීම, රටෙහි ඉහළ අවදානම් ආන්තිකය මෙන්ම දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සැලකිය යුතු ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ විදේශ විනිමය තැන්පතු රැස් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු අතර තරගය ඉහළ යෑම පිළිබිඹු කරමින් විදේශ විනිමය තැන්පතු මත වන පොලී අනුපාතික 2022 වසරේදී සැලකිය යුතු ලෙස ඉහළ යෑමක් වාර්තා විය.** ගෝලීය උද්ධමනය ඉහළ යෑම පාලනය කිරීමට සහ උද්ධමන අපේක්ෂා ඉහළ යෑම වැළැක්වීම සඳහා බොහෝ දියුණු ආර්ථිකයන්හි මහ බැංකු දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ බොහෝ රටවල මූල්‍ය තත්ත්වයන් දැඩි විය. එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව, යුරෝපීය මහ බැංකුව සහ එංගලන්ත මහ බැංකුව 2022 වසරේදී සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නංවන ලදී. මේ අතර, සැලකිය යුතු අන්දමේ ගෙවුම් ශේෂ පීඩන මධ්‍යයේ බැංකු තුළ පැවති උග්‍ර විදේශ විනිමය ද්‍රවශීලතා හිඟයට ප්‍රතිචාර වශයෙන් බලපත්‍රලාභී බැංකු විසින් විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු රැස් කිරීම සඳහා ආකර්ෂණීය පොලී අනුපාතික ලබා දෙන ලදී. 2021 අගෝස්තු මාසයේ සිට දැඩි මුදල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් රුපියල් තැන්පතු උපකරණ සඳහා වූ වෙළඳපොළ පොලී අනුපාතික අඛණ්ඩව ඉහළ යෑමත් සමඟ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් පිරිනමනු ලබන විදේශ විනිමය තැන්පතු පොලී අනුපාතික මත පනවා

10 බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය ගණනය කිරීමේදී, රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම ඇතුළත් නොවන අතර, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් සියලුම රුපියල් ණය සහ අත්තිකාරම්වල පොලී අනුපාතික මත පදනම් වේ.

11 බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය ගණනය කිරීමේදී, රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම ඇතුළත් නොවන අතර, මාසයක් තුළ බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් සියලුම නව රුපියල් ණය සහ අත්තිකාරම්වල පොලී අනුපාතික මත පදනම් වේ.

12 නෛතික පොලී අනුපාතිකය 1990 අංක 06 දරන සිවිල් විධාන සංග්‍රහය (සංශෝධන) පනතේ නිර්වචනය කර ඇති අතර, එය මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් වූ ඕනෑම නීතිමය ක්‍රියාමාර්ගයකදී අදාළ වේ. වෙළඳපොළ පොලී අනුපාතිකය, 1990 අංක 2 දරන ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ නිර්වචනය කර ඇති අතර, ණය දෙන ආයතන විසින් වාණිජමය ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ නීතිමය ක්‍රියාමාර්ගයකදී රුපියල් 150,000කට වඩා වැඩි ණය මුදලක් අයකර ගැනීමේදී, ඒ සඳහා එකඟ වූ පොලී අනුපාතිකයක් නොමැති විටෙක අදාළ වේ.

13 2022 වසරේදී, පවතින ඉහළ පොලී අනුපාතික ව්‍යුහය සැලකිල්ලට ගනිමින් නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය ගණනය කිරීමේ ක්‍රමය සංශෝධනය කරන ලදී. ඒ අනුව, 2022 නොවැම්බර් මාසයෙන් අවසන් වන මාස හය තුළ පැවති මාසික බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකයෙහි සරල සාමාන්‍යය මත පදනම්ව 2023 සඳහා වන නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය ගණනය කරන ලදී.

තිබූ උපරිම සීමාව 2022 මාර්තු මාසයේදී ඉවත් කරන ලදී. මෙමගින් ගෝලීය මෙන්ම දේශීය වෙළඳපොළ තත්ත්වයන්ට අනුකූලව බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය තැන්පතු මත වන පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ යැමට අවස්ථාව ලබා දුන්නේය. ඒ අනුව, එ.ජ. ඩොලර්වලින් සහ ස්ටර්ලින් පවුම්වලින් පවත්වා ගෙන යනු ලබන දේශීය ඉතිරිකිරීමේ තැන්පතු සහ කාලීන තැන්පතු සඳහා පිරිනමන ලද පොලී අනුපාතික 2021 වසර අවසානයට සාපේක්ෂව 2022 වසර අවසානයේදී ඉහළ ගියේය.

## 7.5 මුදල් සහ ණය සමස්තවල ප්‍රවණතා


### සංචිත මුදල්

**සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය මෙන්ම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන තැන්පතු ප්‍රමාණයේ වර්ධනය අඩු වීමත් සමග ආර්ථිකයේ මුදල් පදනම වන සංචිත මුදල් 2021 වසරට සාපේක්ෂව විශේෂයෙන්ම 2022 වසර අවසාන කාලයේදී අඩු වර්ධනයක් වාර්තා කළේය.** උද්ධමනය ඉහළ යැමෙන් වියදම් අවශ්‍යතා වැඩි වීම සහ ඇතැම් අත්‍යවශ්‍ය භාණ්ඩවල සැපයුම් හිඟය මධ්‍යයේ අවිනිශ්චිතතා හේතුවෙන් ඉදිරියේදී ඇති විය හැකි අවශ්‍යතා සඳහා මුදල් ළඟ තබා ගැනීමට වැඩි කැමැත්තක් දැක්වීම හමුවේ මහජනතාව ගනුදෙනු සඳහා වන මුදල් ඉල්ලුම ඉහළ යැම හේතුවෙන් 2022 වසරේ මුල් භාගය තුළදී සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතුණි. කෙසේ වෙතත්, 2022 වසර තුළදී මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කිරීමෙන් පසුව වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යෑම මධ්‍යයේ ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීමේ ඉහළ ආවස්ථික පිරිවැය පිළිබිඹු කරමින් 2022 වසර අවසානය වන විට සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වීම ආරම්භ විය. ඒ අනුව, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය, කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ 2020 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 156.8ක ඉහළ යැම සහ 2021 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 170.3ක ඉහළ යැමට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,026.6ක් දක්වා වසර තුළදී රුපියල් බිලියන 21.5ක අඩු ප්‍රමාණයකින් ඉහළ ගියේය. මේ අතර, 2022 වසර තුළදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නොවෙනස්ව පැවතීමත් සමග බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන තැන්පතු ප්‍රමාණය වසර තුළදී සුළු වැඩි වීමක් වාර්තා කළේය. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන තැන්පතු ප්‍රමාණය 2021 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 171.1කින් සැලකිය යුතු ලෙස ඉහළ යැමට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 322.8ක් දක්වා වසර තුළදී රුපියල් බිලියන 22.1කින් ඉහළ ගියේය. ඒ අනුව, සංචිත මුදල්, 2021 වසර අවසානයේදී වාර්තා වූ සියයට 35.4ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,349.4ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.3කින් වර්ධනය විය. 2021 වසරේදී සංචිත මුදල් රුපියල් බිලියන 341.4කින් සැලකිය යුතු ලෙස ඉහළ යැමට සාපේක්ෂව 2022 වසර තුළදී රුපියල් බිලියන 43.6කින් ඉහළ ගියේය. මේ අතර, නිත්‍ය තැන්පතු පහසුකම සහ නිත්‍ය ණය පහසුකම සඳහා ප්‍රවේශය සීමා කරමින් මහ බැංකුවේ නිත්‍ය පහසුකම් මත බලපත්‍රලාභී වාණිජ බැංකු අධික ලෙස රඳා පැවතීම අවම කිරීම සඳහා මහ බැංකුව විසින් ගෙන ඇති පරිපාලන ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් 2023 ආරම්භයේ සිට සංචිත මුදල් දෛනිකව විශාල වශයෙන් උච්චාවචනය වීමක් දක්නට ලැබුණි. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම සඳහා ප්‍රවේශ වීම සීමා කිරීම හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය අතිරික්ත සංචිත අවිධිමත් කාල අන්තරයන් මත මහ බැංකුවේ පවත්වා ගෙන යැම මගින් දෛනික සංචිත මුදල් ශේෂවල උච්චාවචන ඇති විය.

**මහ බැංකු ශේෂ පත්‍රයේ වත්කම් අනුව සලකා බැලීමේදී 2022 වසර තුළදී සංචිත මුදල් ප්‍රසාරණය සඳහා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් වැඩි වීම මුළුමනින්ම දායක වූ අතර මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් වසර තුළදී සැලකිය යුතු ලෙස අඩු විය.** මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය 2021 වසරේදී රුපියල් බිලියන 1,225.2කින් ඉහළ යැම හා සැසඳීමේදී 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 3,432.5ක් දක්වා රුපියල් බිලියන 1,338.4කින් ඉහළ යැම මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මෙමගින් 2022 වසර තුළදී මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය (ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම්හි ශුද්ධ අගය ගැළපීමෙන් පසු) සැලකිය යුතු ලෙස ඉහළ යැම පිළිබිඹු වේ. රාජ්‍ය ආදායම අඩු වීම, විදේශීය ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් විදේශීය මූල්‍යන සඳහා රජයේ ප්‍රවේශය සීමා වීම සහ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ අවිනිශ්චිතතා හමුවේ රජයේ සුරැකුම්පත් සඳහා වන වෙළඳපොළ කැමැත්ත

7

**7.11 රූප සටහන**
**මහ බැංකු ශේෂ පත්‍රයේ සංයුතිය (අ)**




(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අඩු වීම මධ්‍යයේ මහ බැංකු මූල්‍යන මත රජය අඛණ්ඩව රඳා පැවතීම මත භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපොළෙන් මහ බැංකුව අඛණ්ඩව මිලදී ගැනීම සහ රජය මහ බැංකුව වෙත ඍජු ලෙස භාණ්ඩාගාර බිල්පත් පැවරීම හේතුවෙන් මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය ඉහළ ගියේය. ඒ අනුව, මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය (ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම්හි ශුද්ධ අගය ගැළපීමෙන් පසු) 2022 වසර අවසානයේදී රුපියල් බිලියන 3,197.1ක් දක්වා රුපියල් බිලියන 1,251.7කින් ඉහළ ගියේය. මේ අතර, තාවකාලික අත්තිකාරම් ලෙස රජයට ලබා දුන් ණය ද 2022 වසර තුළදී ඉහළ ගිය අතර එය මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ඉහළ යෑමට හේතු විය. කෙසේ වෙතත්, විදේශ විනිමය හුවමාරු ගිවිසුම් හා සම්බන්ධ විදේශ විනිමය අලාභ හේතුවෙන් මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත සපයන ලද ණය පහළ යෑම සහ කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළදී ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත සහාය වීම සඳහා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ලබා දුන් සහන ණය නැවත පියවීම හේතුවෙන් මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම පාලනය විය. ඒ අනුව, මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් 2021 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 1,255.4ක ඉහළ යෑම හා සැසඳීමේදී 2022 වසර තුළදී රුපියල් බිලියන 1,270.2කින් ඉහළ ගියේය. මේ අතර, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් 2022 වසර තුළදී රුපියල් බිලියන 1,226.6කින් සැලකිය යුතු ලෙස සංකෝචනය වූ අතර එය 2021 වසර තුළදී රුපියල් බිලියන 914.0කින් සංකෝචනය වී 2021 අගෝස්තු මාසයේ සිට ශුද්ධ විදේශීය වත්කම් ඍණ අගයක් ගන්නා ලදී. ප්‍රධාන වශයෙන් අත්‍යවශ්‍ය ආනයන සඳහා පහසුකම් සැලසීමට සහ විශේෂයෙන්ම 2022 වසරේ මුල් කාලයේදී රජයේ විදේශීය ණය වගකීම් සපුරාලීම සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීමට මහ බැංකුව සතු විදේශීය වත්කම්වලින් විශාල ප්‍රමාණයක් යොදා ගැනීම හේතුවෙන් 2022 වසරේදී මහ බැංකුවේ විදේශීය වත්කම් ප්‍රමාණය අඩු විය. මහ බැංකුවේ විදේශීය වත්කම්වලට සාපේක්ෂව නොපියවූ විදේශීය වගකීම් ඉහළ මට්ටමක පැවති අතර එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම මත විදේශීය වත්කම් ඉහළ යෑමට වඩා විදේශීය වගකීම් විශාල ලෙස ඉහළ යෑම සිදු විය. එමගින් 2022 වසරේදී මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ප්‍රමාණය තවදුරටත් අඩු විය. මහ බැංකුව විසින් එළඹෙන ලද විදේශ විනිමය හුවමාරු ගිවිසුම් සඳහා අදාළ වන ණය ගෙවීමේ කාලය දීර්ඝ කිරීම සහ ආසියානු නිෂ්කාශන සංගමය වෙත ගෙවිය යුතු මුදල් කල් දැමීම ද මහ බැංකුවේ විදේශීය වගකීම් ඉහළ යෑම සඳහා හේතු විය. මේ අතර, ශ්‍රී ලංකා රුපියල්වලට අනිවාර්යෙන් පරිවර්තනය කිරීමට යටත් අපනයන ආදායම සහ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවලින් අවශේෂ කොටස බලපත්‍රලාභී බැංකුවලින් මහ බැංකුව මිලදී ගැනීම ඉහළ යෑම හේතුවෙන් 2022 වසර අවසානය වන විට මහ බැංකුවේ විදේශීය වත්කම් ඉහළ යෑමක් නිරීක්ෂණය විය.

**පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීම සහ සංචිත මුදල් ප්‍රසාරණය අඩු මට්ටමක පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස පුළුල් මුදල් සැපයුම සහ සංචිත මුදල් අතර සම්බන්ධය පෙන්නුම් කරනු ලබන මුදල් ගුණකය 2022 වසර තුළදී ඉහළ ගියේය.** ඒ අනුව, 2022 වසර තුළදී සංචිත මුදල් අඩු ප්‍රමාණයකින් ප්‍රසාරණය වීම මධ්‍යයේ රාජ්‍ය අංශයේ ණය ලබාගැනීම් ඉහළ යෑම හා මුදල් ප්‍රමාණ රුපියල්වලින් ගණනය කිරීමේදී ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම නිසා සිදු වූ බලපෑම පිළිබිඹු කරමින් පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) ප්‍රසාරණය වීම හේතුවෙන් $M_{2b}$ මුදල් සැපයුම මත පදනම් වන මුදල් ගුණකය 2021 වසර අවසානයේදී වාර්තා කළ 8.15 සිට 2022 වසර අවසානය වන විට 9.11ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේදී මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් අඩු වීම සහ මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ව්‍යවහාර මුදල් හා තැන්පතු අතර අනුපාතය 2021 වසර අවසානයේදී වාර්තා වූ සියයට 8.0 සිට 2022 වසර අවසානය වන විට සියයට 6.4ක් දක්වා අඩු විය.

7


## පුළුල් මුදල් ($M_{2b}$) සැපයුම සහ දේශීය ණය

**රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම මෙන්ම විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා බැංකු පද්ධතියේ රුපියල්වලින් ගණනය කළ දේශීය ණය ඉහළ යෑම (එනම් විදේශ මුදලින් නාමනය කරන ලද දේශීය ණය ශ්‍රී ලංකා රුපියල්වලින් ගණනය කිරීමේදී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම) මධ්‍යයේ වුවද පෞද්ගලික අංශයට ලබා දුන් ණය සැලකිය යුතු ලෙස සංකෝචනය වීම හේතුවෙන් 2022 වසරේදී පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වර්ධනය මන්දගාමී විය.** දැඩි මුදල් තත්ත්වයන්හි සහායයෙන් 2021 වසරේ මුල් කාලයේ සිට ක්‍රමයෙන් මන්දගාමී වූ පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම මධ්‍යයේ දේශීය ණය රුපියල්වලින් ගණනය කිරීමේදී සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම හේතුවෙන් 2022 වසරේ මුල් කාලයේදී සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර 2022 අප්‍රේල් මස අවසානය වන විට සියයට 20.0ක උපරිම අගයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, රාජ්‍ය අංශය වෙත විශේෂයෙන්ම බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද මුදල් තත්ත්වයන් විශාල ලෙස ලෙස දැඩි කිරීම මත පෞද්ගලික අංශයට ලබා දුන් ණය සංකෝචනය වීම හේතුවෙන් 2022 මැයි මාසයේ සිට පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය මන්දගාමී වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2022 වසර අවසානය වන විට සියයට 15.4ක් දක්වා මන්දගාමී විය. එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කළ පසු[14] පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2022 වසර අවසානය වන විට සියයට 7ක් පමණ දක්වා මන්දගාමී වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වගකීම් අංශයට අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වාගෙන යනු ලබන මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු ඉහළ යෑම 2022 වසරේදී පුළුල් මුදල් සැපයුම ප්‍රසාරණය වීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය.**

14 මෙහිදී සියලුම විදේශ මුදලින් නාමනය කරන ලද අගයන් 2022 පෙබරවාරි මස අවසානයේ පැවති විනිමය අනුපාතිකය භාවිත කරමින් රුපියල්වලින් ගණනය කිරීමෙන් මුදල් සැපයුමේ වර්ධනය ඇස්තමේන්තු කර ඇත.

**7.12 රූප සටහන**
**පුළුල් මුදල්වල ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස සඳහා තුඩු දුන් සාධක (වත්කම් අනුව) (අ)**




(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2021 වසරේදී වාර්තා වූ සියයට 77ක දායකත්වය හා සැසඳීමේදී 2022 වසරේදී පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රසාරණය සඳහා මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු ඉහළ යෑම විශාල වශයෙන් දායක විය. 2022 වසර තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු ද සුළු වශයෙන් ඉහළ ගිය අතර ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික මධ්‍යයේ ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීමේ ඉහළ ආවස්ථික පිරිවැය හේතුවෙන් මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් වසර තුළදී සංකෝචනය විය. මුදල් වෙළඳපොළෙහි හිඟ ද්‍රවශීලතා තත්ත්ව මධ්‍යයේ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පිරිනමනු ලැබූ ඉහළ තැන්පතු පොලී අනුපාතිකවල බලපෑම පිළිබිඹු කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වාගෙන යනු ලබන මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු 2021 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 958.8ක ඉහළ යෑමට සාපේක්ෂව 2022 වසරේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 17.9ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 1,648.6කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, ඉහළ පොලී අනුපාතික සහ ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම මධ්‍යයේ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉල්ලුම් තැන්පතු වර්ධනය 2021 වසර අවසානයේ පැවති සියයට 26.0ට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 5.3ක් දක්වා අඩු විය. 2021 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 22.4ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් 2022 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 5.4කින් සංකෝචනය විය.

7

### 7.4 සංඛ්‍යා සටහන
### මුදල් සමස්තවල ප්‍රවණතා

රුපියල් බිලියන

| අයිතමය | 2020 අවසානයට | 2021 අවසානයට | 2022 අවසානයට (අ) | වෙනස 2020 ප්‍රමාණය | 2020 % | 2021 ප්‍රමාණය | 2021 % | 2022 ප්‍රමාණය | 2022 % |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. සමස්ත ව්‍යවහාර මුදල් එකතුව | 834.8 | 1,005.1 | 1,026.6 | 156.8 | 23.1 | 170.3 | 20.4 | 21.5 | 2.1 |
| 1.1 මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | 641.0 | 784.4 | 742.0 | 146.8 | 29.7 | 143.4 | 22.4 | -42.4 | -5.4 |
| 1.2 වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල් | 193.8 | 220.6 | 284.5 | 10.0 | 5.5 | 26.9 | 13.9 | 63.9 | 28.9 |
| 2. මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු (ආ) | 129.6 | 300.7 | 322.8 | -125.0 | -49.1 | 171.1 | 132.0 | 22.1 | 7.4 |
| 3. මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු (ඇ) | 0.03 | 0.01 | 0.01 | | | | | | |
| **4. සංචිත මුදල් (1 + 2 + 3)** | **964.4** | **1,305.8** | **1,349.4** | **31.8** | **3.4** | **341.4** | **35.4** | **43.6** | **3.3** |
| 5. වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | 536.1 | 675.4 | 711.6 | 164.9 | 44.4 | 139.3 | 26.0 | 36.1 | 5.3 |
| **6. පටු මුදල් සැපයුම, $M_1$ (1.1 + 5)** | **1,177.2** | **1,459.9** | **1,453.6** | **311.7** | **36.0** | **282.7** | **24.0** | **-6.3** | **-0.4** |
| 7. වාණිජ බැංකු වෙතැති මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු | 7,318.6 | 8,179.0 | 9,043.5 | 1,271.4 | 21.0 | 860.4 | 11.8 | 864.4 | 10.6 |
| **8. පුළුල් මුදල් සැපයුම, $M_2$ (6 + 7)** | **8,495.8** | **9,638.9** | **10,497.1** | **1,583.1** | **22.9** | **1,143.1** | **13.5** | **858.1** | **8.9** |
| 9. ගැළපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු (ඈ) | 909.9 | 1,008.4 | 1,792.6 | 198.5 | 27.9 | 98.5 | 10.8 | 784.2 | 77.8 |
| **10. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම, $M_{2b}$ (8 + 9)** | **9,405.7** | **10,647.3** | **12,289.6** | **1,781.6** | **23.4** | **1,241.6** | **13.2** | **1,642.3** | **15.4** |
| **මුදල් ගුණකය, $M_{2b}$** | **9.75** | **8.15** | **9.11** | | | | | | |
| **සංසරණ ප්‍රවේගය, $M_{2b}$ (ඉ)** | **1.84** | **1.73** | **2.05** | | | | | | |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු සහ මහ බැංකුව වෙතැති ප්‍රාථමික වෙළඳුන්ගේ තැන්පතු ඇතුළත් වේ.

(ඇ) මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු 2020 වසර අවසානයේදී රුපියල් මිලියන 30.4ක් ලෙස, 2021 වසර අවසානයේදී රුපියල් මිලියන 5.5ක් ලෙස සහ 2022 වසර අවසානයේදී රුපියල් මිලියන 11.6ක් ලෙස පැවතුණි.

(ඈ) අක්වෙරළ බැංකු ඒකකවල නේවාසික තැන්පතු සහ දේශීය බැංකු ඒකකවල විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවලින් දේශීය වගකීම් ලෙස හඳුනාගත් කොටසක් ඇතුළත් වේ.

(ඉ) මුදලේ සංසරණ ප්‍රවේගය පුළුල් මුදල් ($M_{2b}$) වාර්ෂික සාමාන්‍ය සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පදනම් වර්ෂය වෙනස් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (පදනම් වර්ෂය 2015) මත පදනම්ව ගණනය කර ඇත.

**පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වත්කම් අංශය සලකා බැලීමේදී 2021 වසරේදී දක්නට ලැබුණු ප්‍රවණතාව අඛණ්ඩව පෙන්නුම් කරමින් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් අඩු වීම හේතුවෙන් 2022 වසරේදී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස සංකෝචනය වූ අතර බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් වසරේ දෙවන භාගයේදී වර්ධනයක් වාර්තා කළේය.** විදේශ විනිමය වත්කම් ඉහළ යෑමට සාපේක්ෂව විදේශ විනිමය වගකීම් සැලකිය යුතු ලෙස වැඩි වීම මෙන්ම විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ බලපෑම හේතුවෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් 2021 වසරේදී රුපියල් බිලියන 914.0කින් සංකෝචනය වීමට සාපේක්ෂව 2022 වසර තුළදී රුපියල් බිලියන 1,226.6කින් සැලකිය යුතු ලෙස සංකෝචනය විය. කලාපීය රටවල් සමඟ මහ බැංකුව විසින් එළඹෙන ලද විදේශ විනිමය හුවමාරු ගිවිසුම් වෙතින් ලබා ගත් ණය පියවීමේ කාලය දීර්ඝ කිරීම සහ ආසියානු නිෂ්කාශන සංගමය වෙත ගෙවිය යුතු විශාල මුදල් ප්‍රමාණය හේතුවෙන් ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් වෙත ගෙවිය යුතු විදේශ මුදල් ප්‍රමාණය වැඩිවීමත් සමඟ මහ බැංකුවේ විදේශීය වගකීම් ඉහළ ගියේය. ශ්‍රී ලංකා රුපියල්වලට අනිවාර්යෙන් පරිවර්තනය කිරීමට යටත් අපනයන ආදායම සහ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවලින් අවශේෂ කොටස බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් මහ බැංකුව මිලදී ගැනීම හේතුවෙන් මහ බැංකුවේ විදේශීය වත්කම් ඉහළ ගිය ද සැලකිය යුතු ගෙවුම් ශේෂ පීඩන මධ්‍යයේ අත්‍යවශ්‍ය ආනයන සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය විදේශ විනිමය සැපයීමට සහ විශේෂයෙන්ම 2022 වසරේ මුල් කාලයේදී රජයේ විදේශීය ණය සේවා වගකීම් සපුරාලීම සඳහා මෙම වත්කම් යොදා ගන්නා ලදී. කෙසේ වෙතත්, වෙළඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතාව ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ දළ නිල සංචිත ඉහළ නංවා ගැනීම සඳහා මහ බැංකුව විසින් විදේශ විනිමය මිලදී ගැනීම හේතුවෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ නැංවිණි. මේ අතර, අක්වෙරළ බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑමත් සමඟ බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් 2021 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 141.5ක වැඩිවීමට

7

**7.5 සංඛ්‍යා සටහන**

**සංචිත මුදල් සහ පුළුල් මුදල් ($M_{2b}$) සැපයුමෙහි වත්කම් අංශය**

රුපියල් බිලියන

| අයිතමය | 2021 අවසානයට | 2022 අවසානයට (අ) | වෙනස | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2021 | | 2022 | |
| | | | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| **සංචිත මුදල්** | **1,305.8** | **1,349.4** | **341.4** | **35.4** | **43.6** | **3.3** |
| මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් | -387.3 | -1,613.9 | -914.0 | -173.5 | -1,226.6 | -316.7 |
| මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් | 1,693.1 | 2,963.2 | 1,255.4 | 286.8 | 1,270.2 | 75.0 |
| රජයට ලබා දුන් ශුද්ධ ණය | 2,094.1 | 3,432.5 | 1,225.2 | 141.0 | 1,338.4 | 63.9 |
| වාණිජ බැංකුවලට ලබා දුන් ණය | 143.2 | -11.5 | 28.7 | 25.1 | -154.6 | -108.0 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) (ආ) | -544.2 | -457.8 | 1.5 | 0.3 | 86.4 | 15.9 |
| **පුළුල් මුදල් ($M_{2b}$)** | **10,647.3** | **12,289.6** | **1,241.6** | **13.2** | **1,642.3** | **15.4** |
| ශුද්ධ විදේශීය වත්කම් | -982.0 | -1,766.8 | -772.5 | -368.8 | -784.8 | -79.9 |
| මුදල් අධිකාරීන් (ඇ) | -387.3 | -1,613.9 | -914.0 | -173.5 | -1,226.6 | -316.7 |
| වාණිජ බැංකු | -594.7 | -153.0 | 141.5 | 19.2 | 441.8 | 74.3 |
| ශුද්ධ දේශීය වත්කම් | 11,629.3 | 14,056.4 | 2,014.1 | 20.9 | 2,427.2 | 20.9 |
| දේශීය ණය | 14,002.0 | 16,632.3 | 2,280.8 | 19.5 | 2,630.3 | 18.8 |
| රජයට ලබා දුන් ශුද්ධ ණය | 5,832.4 | 7,471.1 | 1,284.4 | 28.2 | 1,638.7 | 28.1 |
| මහ බැංකුව | 2,094.1 | 3,432.5 | 1,225.2 | 141.0 | 1,338.4 | 63.9 |
| වාණිජ බැංකු | 3,738.3 | 4,038.6 | 59.2 | 1.6 | 300.3 | 8.0 |
| රාජ්‍ය සංස්ථාවලට/රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය | 1,188.1 | 1,747.0 | 185.9 | 18.6 | 558.9 | 47.0 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය | 6,981.4 | 7,414.1 | 810.5 | 13.1 | 432.7 | 6.2 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) (ආ) | -2,372.7 | -2,575.8 | -266.7 | -12.7 | -203.2 | -8.6 |

(අ) තාවකාලික

(ආ) අනෙකුත් අයිතම වත්කම් සහ අනෙකුත් අයිතම වගකීම් අතර වෙනස මගින් ගණනය කරනු ලැබේ.


(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් මෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන රජයේ රන් පවුම් ශේෂය ද මෙහි අන්තර්ගත වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සාපේක්ෂව 2022 වසරේදී රුපියල් බිලියන 441.8කින් වර්ධනය වූ අතර දේශීය බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් මෙම වසර තුළදී සංකෝචනය විය. ප්‍රධාන වශයෙන් විදේශ බැංකු සමඟ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ඉහළ යෑම සහ අනේවාසිකයන් වෙත ණය දීම මෙන්ම විශේෂයෙන්ම කෙටි කාලීන ණය වගකීම් පියවීම හේතුවෙන් විදේශීය වගකීම් අඩු වීම මත අක්වෙරළ බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් 2022 වසරේදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, විදේශ බැංකු සමඟ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ඉහළ යෑමට සාපේක්ෂව අනේවාසිකයන් සතු තැන්පතු වගකීම් ලෙස විදේශ විනිමය වගකීම් වැඩි වශයෙන් ඉහළ යෑම හේතුවෙන් දේශීය බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් 2022 වසරේදී සංකෝචනය විය.

**බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය 2022 වසර තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර එය ශුද්ධ දේශීය වත්කම් ප්‍රසාරණයට හේතු විය.** 2021 වසරේදී දක්නට ලැබුණු ප්‍රවණතාව අඛණ්ඩව පෙන්නුම් කරමින්, රජයේ ආදායම් රැස්කිරීම අපේක්ෂිත මට්ටමට වඩා අඩු වීම සහ විදේශීය මූල්‍යන සඳහා ප්‍රවේශය සීමා වීම මධ්‍යයේ 2022 වසරේදී රජයේ ඉහළ අරමුදල් අවශ්‍යතාව දේශීය බැංකු පද්ධතියෙන් විශේෂයෙන්ම මහ බැංකුවෙන් විශාල වශයෙන් සපුරා ගන්නා ලදී. මෙම කාලය තුළදී බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම මගින් පෞද්ගලික අංශයේ ආයෝජන පහළ යෑම පෙන්නුම් කරයි. බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය 2021 වසරේදී රුපියල් බිලියන 1,284.4කින් ඉහළ යෑමට සාපේක්ෂව 2022 වසර තුළදී රුපියල් බිලියන 1,638.7කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2022 වසරේදී මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 1,338.4කින් ඉහළ ගිය අතර එය බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ඉහළ යෑම සඳහා සියයට 80කට වඩා වැඩි දායකත්වයක් සැපයීය. භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවලදී වෙළඳපොළෙන් සපුරා ගැනීමට නොහැකි වූ හිඟ මුදල් ප්‍රමාණය මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම හරහා ලබා දීමට අමතරව මුදල් ප්‍රවාහ හිඟතාව මත රජය විසින් මහ බැංකුව වෙත භාණ්ඩාගාර බිල්පත් සෘජුවම පැවරීම මෙන්ම තාවකාලික අත්තිකාරම් ලබා දීම මගින් මහ බැංකුව විසින් රජය වෙත මූල්‍යන පහසුකම් සපයන ලදී. භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර මෙන්ම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීම හේතුවෙන් 2022 වසර තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත

**7.13 රූප සටහන**
**දේශීය ණයෙහි මාසික වෙනස් වීම (අ)**




(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය ද රුපියල් බිලියන 300කින් පමණ ඉහළ ගියේය. මේ අතර, මෙම වසර තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති රජයේ අයිරා ශේෂයන් සැලකිය යුතු ලෙස පහළ ගියේය.

**ප්‍රධාන වශයෙන් විදේශ මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේදී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ බලපෑම හේතුවෙන් රජය සතු වාණිජ ව්‍යාපාර බැංකු පද්ධතිය වෙතින් ලබා ගත් ණය 2022 වසරේදී ඉහළ ගිය අතර රජය සතු වාණිජ ව්‍යාපාරවල දුර්වල මූල්‍ය කාර්යසාධනය හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් අඛණ්ඩව ණය ගැනීමට සිදු විය.** රජය සතු වාණිජ ව්‍යාපාර බැංකු පද්ධතිය වෙතින් ලබා ගත් ණය 2021 වසරේදී රුපියල් බිලියන 185.9කින් ඉහළ යෑමට සාපේක්ෂව 2022 වසර තුළදී රුපියල් බිලියන 558.9කින් සැලකිය යුතු ලෙස වැඩි වූ අතර ඉන් සියයට 70කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා විදේශ මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේදී විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම නිසා ඇති වූ ප්‍රසාරණාත්මක බලපෑම හේතු විය. ඉන්ධන ආනයනයට පහසුකම් සැලසීම සඳහා වූ ඉහළ මූල්‍යන අවශ්‍යතාව පිළිබිඹු කරමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබා ගත් ණය ප්‍රමාණය 2022 වසර තුළදී රුපියල් බිලියන 477.3කින් ඉහළ ගිය අතර එය රජය සතු වාණිජ ව්‍යාපාර ලබා ගත් සමස්ත ණය ප්‍රමාණය ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක විය. තවද, වසර තුළදී ශ්‍රීලංකන් ගුවන් සමාගම ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 36.5කින් ඉහළ ගිය අතර ලංකා විදුලිබල මණ්ඩලය ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 31.9කින් ඉහළ ගියේය. මීට අමතරව, සීමාසහිත ලංකා නැව් සංස්ථාව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා ගත් ණය ප්‍රමාණය ද 2022 වසර තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, වී අලෙවි මණ්ඩලය සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් 2022 වසරේදී ඒවායේ ණය වගකීම් ශුද්ධ පදනම මත බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නැවත පියවා ඇත. ඒ අනුව, රජය සතු වාණිජ ව්‍යාපාර ලබා ගත් නොපියවූ ණය ප්‍රමාණය 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,747.0ක් විය.[15]

**දැඩි මුදල් තත්ත්ව සහ ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑමට ප්‍රතිචාර වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය 2022 වසරේ මැද භාගයේ සිට අඛණ්ඩව සංකෝචනය විය.** විදේශ මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේදී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම හේතුවෙන් මෙන්ම පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයෙහි සාමාන්‍ය වර්ධනය ද හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය 2022 වසරේ මුල් කාලයේදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කිරීම සහ බැංකු පද්ධතිය තුළ පැවති විශාල හිඟ ද්‍රවශීලතාව පිළිබිඹු කරමින් 2022 අප්‍රේල් මාසයේ සිට වෙළඳපොළ ණය පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ යෑමත් සමඟ 2022 ජූනි මාසයේ සිට මාසික පදනමින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස සංකෝචනය වීම ආරම්භ විය. විශේෂයෙන්ම, 2022 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලය තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය සමස්තයක් ලෙස රුපියල් බිලියන 340.7කින් සංකෝචනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් වාර්ෂික ණය ප්‍රසාරණය 2021 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 810.5ට සාපේක්ෂව 2022 වසර තුළදී රුපියල් බිලියන 432.7කට සීමා විය. ඒ අනුව, පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021

15 2022 දෙසැම්බර් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි රජයේ ඇපකර යටතේ ලබා ගත් රුපියල් බිලියන 884.1ක ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නොපියවූ විදේශ විනිමය ණය ප්‍රමාණය මධ්‍යම රජයේ ණය ලෙස හුවමාරු කිරීම මෙහි ඇතුළත් නොවේ.

**7.14 රූප සටහන**
**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය (අ)**





(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසර අවසානයේ වාර්තා වූ සියයට 13.1 සිට 2022 අවසානය වන විට සියයට 6.2ක් දක්වා මන්දගාමී විය. විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමෙන් ඇති වූ බලපෑම ඉවත් කළ පසු[16] පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව 2022 වසරේදී රුපියල් බිලියන 231.1කින් සංකෝචනය වී වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.3ක සංකෝචනය වීමක් වාර්තා කර ඇති බවට ඇස්තමේන්තු කර ඇත.

**දැඩි මුදල් තත්ත්ව, ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ආදියෙහි සැලකිය යුතු බලපෑම පිළිබිඹු කරමින්, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණයට අනුව, ප්‍රධාන ආර්ථික අංශ වෙත සපයන ලද ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2022 වසර තුළදී විශේෂයෙන්ම වසරේ දෙවන භාගය තුළදී සැලකිය යුතු ලෙස පහළ ගියේය.** ප්‍රධාන වශයෙන් විදේශ මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේදී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ බලපෑම හේතුවෙන් 2022 වසරේ පළමු භාගය තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සියලු ප්‍රධාන ආර්ථික අංශ වෙත සපයන ලද සමස්ත ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය ඉහළ ගියේය. විදේශ මුදලින් නාමනය කරන ලද ණය විශාල ප්‍රමාණයක් කර්මාන්ත හා සේවා අංශ සඳහා වන බැවින් කර්මාන්ත හා සේවා අංශ සඳහා වූ ණය වර්ධනය ඉහළ අගයක් විය. කෙසේ වෙතත්, ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම මෙන්ම සැපයුම් හිඟතාව, දැඩි මුදල් තත්ත්ව මධ්‍යයේ වෙළඳපොළ ණය පොලී අනුපාතික විශාල ලෙස ඉහළ යෑම සහ සැලකිය යුතු රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ හේතුවෙන් ණය වර්ධන ප්‍රවණතාව වෙනස් වී 2022 වසර අවසානය වන විට සියලුම ප්‍රධාන ආර්ථික අංශ වෙත සපයන ලද ණය වර්ධනය මන්දගාමී විය. ආර්ථිකයේ එක් එක් අංශ වෙත ලබා දුන් ණය සලකා බැලීමේදී, කර්මාන්ත අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේ වූ සියයට 12.6 සිට 2022 වසර අවසානය වන විට සියයට 8.4ක් දක්වා මන්දගාමී විය. කර්මාන්ත අංශය තුළ, ඉදිකිරීම් අමුද්‍රව්‍ය හිඟ වීම සහ යෙදවුම් පිරිවැය ඉහළ යෑම මෙන්ම ඉහළ පොලී අනුපාතික යටතේ ඉල්ලුම අඩු වීම මධ්‍යයේ 2022 වසර තුළදී ඉදිකිරීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් පහළ යෑම පිළිබිඹු කරමින් ඉදිකිරීම් උප අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේදී පැවති සියයට 13.1 සිට 2022 වසර අවසානය වන විට සියයට 3.1ක් දක්වා සැලකිය යුතු ලෙස මන්දගාමී විය. ගෝලීය ඉල්ලුම් තත්ත්ව පහළ යෑම සහ සැපයුම් අංශයේ අවහිරතා හේතුවෙන් රෙදිපිළි සහ ඇඟලුම් උප අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේදී පැවති සියයට 16.1 සිට 2022 වසර අවසානය වන විට සියයට 7.6ක් දක්වා සැලකිය යුතු ලෙස මන්දගාමී විය. සේවා අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය ද 2021 වසර අවසානයේදී පැවති සියයට 16.3 සිට 2022 වසර අවසානය වන විට සියයට 4.2ක් දක්වා මන්දගාමී විය. සේවා අංශය තුළ, වෙළඳාම, ප්‍රවාහනය සහ සන්නිවේදනය සම්බන්ධ දුර්වල ක්‍රියාකාරිත්වය මෙන්ම යෙදවුම් පිරිවැය ඉහළ යෑම පිළිබිඹු කරමින් තොග හා සිල්ලර, ප්‍රවාහන සහ සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ යන

**7.15 රූප සටහන**
**ප්‍රධාන අංශවලට ලබා දුන් පෞද්ගලික අංශයේ ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (%) (අ)**




(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

16 මෙහිදී සියලුම විදේශ මුදලින් නාමනය කරන ලද ණය 2022 පෙබරවාරි මස අවසානයේ පැවති විනිමය අනුපාතිකය භාවිත කරමින් රුපියල්වලින් ගණනය කිරීමෙන් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය වර්ධනය ඇස්තමේන්තු කර ඇත.

### 7.6 සංඛ්‍යා සටහන
### වාණිජ බැංකු විසින් ලබා දුන් ණය සහ අත්තිකාරම්හි ආංශික වර්ගීකරණය (අ) (ආ)

රුපියල් බිලියන

| අංශය | 2021 අවසානයට (ඇ) | 2022 අවසානයට (ඈ) | 2022 දායකත්වය (%) | 2022 ප්‍රතිශතාංක වෙනස |
|---|---|---|---|---|
| **කෘෂිකාර්මික සහ ධීවර** | **551.7** | **601.7** | **7.7** | **9.1** |
| *එයින්,* තේ | 101.2 | 108.2 | 1.4 | 6.9 |
| රබර් | 41.4 | 59.1 | 0.8 | 42.7 |
| පොල් | 33.7 | 30.0 | 0.4 | -11.0 |
| වී | 44.4 | 38.9 | 0.5 | -12.5 |
| එළවළු, පලතුරු සහ සුළු ආහාර භෝග | 30.9 | 32.2 | 0.4 | 4.1 |
| ධීවර | 24.0 | 26.4 | 0.3 | 10.0 |
| **කර්මාන්ත** | **2,860.9** | **3,100.6** | **39.8** | **8.4** |
| *එයින්,* ඉදිකිරීම් | 1,525.1 | 1,571.9 | 20.2 | 3.1 |
| ආහාර සහ පාන වර්ග | 174.7 | 214.6 | 2.8 | 22.8 |
| රෙදිපිළි සහ ඇඟලුම් | 273.1 | 293.8 | 3.8 | 7.6 |
| සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 152.8 | 144.9 | 1.9 | -5.1 |
| **සේවා** | **1,996.5** | **2,079.6** | **26.7** | **4.2** |
| *එයින්,* තොග සහ සිල්ලර වෙළඳාම | 570.2 | 563.7 | 7.2 | -1.1 |
| සංචාරක ව්‍යාපාරය | 288.2 | 372.8 | 4.8 | 29.4 |
| මූල්‍ය සහ ව්‍යාපාරික සේවා | 437.2 | 446.6 | 5.7 | 2.2 |
| නාවික, ගුවන් සහ භාණ්ඩ නිෂ්කාශනය | 30.3 | 32.0 | 0.4 | 5.9 |
| **පෞද්ගලික ණය සහ අත්තිකාරම් (ඉ)** | **1,799.8** | **2,013.0** | **25.8** | **11.8** |
| *එයින්,* කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ | 375.0 | 368.5 | 4.7 | -1.7 |
| උකස් ණය | 302.4 | 423.4 | 5.4 | 40.0 |
| ණය කාඩ්පත් | 144.8 | 149.3 | 1.9 | 3.2 |
| **එකතුව (ඊ)** | **7,208.8** | **7,794.8** | **100.0** | **8.1** |

(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වේ.
(ආ) ණය සහ අත්තිකාරම්වලට අයිරා සහ වට්ටම් කළ බිල්පත් ඇතුළත් වන අතර එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ ඇතුළත් නොවේ.
(ඇ) සංශෝධිත
(ඈ) තාවකාලික
(ඉ) 'කර්මාන්ත' යටතේ වර්ගීකරණය කර ඇති 'ඉදිකිරීම්' කාණ්ඩයට අයත්වන පෞද්ගලික නිවාස ණය ඉවත්කර ඇති අතර ආරක්ෂණ ජාල ආශ්‍රිත ණය ක්‍රම මගින් ලබාදෙන ණය ඇතුළත් වේ.
(ඊ) ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙන්, කාර්තුමය සමීක්ෂණයට අනුව පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය, මුදල් සමීක්ෂණයේ ඇති එම අගයට වඩා වෙනස් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

උප අංශ වෙත ලබා දුන් ණය 2022 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 1.1කින්, සියයට 27.1කින් සහ සියයට 21.8කින් සංකෝචනය විය. පොලී අනුපාතික ඉහළ යෑම මධ්‍යයේ මූල්‍ය සහ ව්‍යාපාරික සේවා සඳහා ණය ලබා දීම පහළ මට්ටමක පැවතීම ද සේවා අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය අඩු වීමට හේතු විය. කෙසේ වෙතත්, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ක්‍රමයෙන් වර්ධනය වීම මෙන්ම ණය ආපසු ගෙවීම සඳහා ලබා දෙන සහන කාලය දීර්ඝ කිරීම සහ අනෙකුත් සහනදායී ක්‍රියාමාර්ග පිළිබිඹු කරමින් සංචාරක උප අංශය වෙත ලබා දුන් ණය ප්‍රසාරණය වූ අතර 2022 වසර අවසානය වන විට සියයට 29.4ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. කෘෂිකාර්මික හා ධීවර අංශය සඳහා ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානය වන විට පැවති සියයට 12.7 හා සැසඳීමේදී 2022 වසර අවසානය වන විට සියයට 9.1ක් දක්වා මන්දගාමී විය. මෙම අංශය තුළ, 2022 වසර තුළදී පොල් සහ වී උප අංශ වෙත ලබා දුන් ණය සංකෝචනය වූ අතර තේ සහ රබර් උප අංශ වෙත ලබා දුන් ණයෙහි යම් වර්ධනයක් දක්නට ලැබුණි. පරිභෝජනය ආශ්‍රිත ණය ඉහළ යෑම පිළිබිඹු කරමින් පෞද්ගලික ණය සහ අත්තිකාරම් ලෙස ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේදී පැවති සියයට 10.3ට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 11.8ක් දක්වා ඉහළ ගියේය. ජීවන වියදම ඉහළ යෑම මධ්‍යයේ මහජනතාව මුහුණ දෙන දුෂ්කරතා පිළිබිඹු කරමින් උකස් ආශ්‍රිත අත්තිකාරම් 2022 වසර තුළදී රුපියල් බිලියන 121.0කින් පමණ ඉහළ ගිය අතර උකස් ආශ්‍රිත අත්තිකාරම්හි 2021 වසරේදී වාර්තා වූ සියයට 21.6ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 40.0ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ යටතේ ලබා දුන් ණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසර අවසානයේදී පැවති සියයට 13.3ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 1.7කින් සංකෝචනය විය. ණය කාඩ්පත් අත්තිකාරම් වර්ධනය ද වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසර අවසානයේදී වූ සියයට 13.3 හා සැසඳීමේදී

**7.7 සංඛ්‍යා සටහන**

**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් සමස්ත ණය ශේෂයේ පරිණත කාල පිළිබඳ විශ්ලේෂණය (අ) (ආ)**

| අංශය | පරිණත කාලය | දෙසැම්බර් 2021 (ඇ) | | දෙසැම්බර් 2022 (ඈ) | |
|---|---|---|---|---|---|
| | | දායකත්වය (%) | වර්ධනය (%) | දායකත්වය (%) | වර්ධනය (%) |
| කෘෂිකාර්මික සහ ධීවර | කෙටි කාලීන | 4.6 | 17.4 | 4.8 | 12.0 |
| | මැදි කාලීන | 1.6 | 9.2 | 1.6 | 3.0 |
| | දිගු කාලීන | 1.4 | 2.4 | 1.4 | 6.5 |
| කර්මාන්ත | කෙටි කාලීන | 12.2 | 19.5 | 12.4 | 9.8 |
| | මැදි කාලීන | 8.4 | 10.8 | 7.9 | 1.8 |
| | දිගු කාලීන | 19.1 | 9.4 | 19.5 | 10.4 |
| සේවා | කෙටි කාලීන | 9.3 | 21.7 | 9.8 | 14.1 |
| | මැදි කාලීන | 8.8 | 9.9 | 7.7 | -5.5 |
| | දිගු කාලීන | 9.6 | 17.5 | 9.2 | 3.4 |
| පෞද්ගලික ණය සහ අත්තිකාරම් | කෙටි කාලීන | 9.8 | 19.4 | 11.1 | 23.2 |
| | මැදි කාලීන | 5.0 | 3.5 | 5.2 | 11.4 |
| | දිගු කාලීන | 10.2 | 6.0 | 9.5 | 1.2 |
| එකතුව | කෙටි කාලීන | 35.9 | 19.7 | 38.1 | 14.8 |
| | මැදි කාලීන | 23.9 | 8.7 | 22.3 | 5.1 |
| | දිගු කාලීන | 40.2 | 10.1 | 39.5 | 6.3 |

(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වේ.
(ආ) මූලික කල්පිරීම පදනම් කරගනිමින් ණය වර්ගීකරණය සිදුකර ඇති අතර එය වසරකට වඩා අඩු - කෙටි කාලීන, වසර 1-5 අතර - මැදි කාලීන හා වසර පහකට වඩා වැඩි - දිගු කාලීන වශයෙන් දක්වා ඇත.
(ඇ) සංශෝධිත
(ඈ) තාවකාලික

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

2022 වසර අවසානය වන විට සියයට 3.2ක් දක්වා පහළ ගියේය. මේ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය ශේෂයේ පරිණත කාල පිළිබඳව සැලකීමේදී, 2021 වසරේ අවසානයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියලුම පරිණත කාල සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ණය ප්‍රසාරණයේ මන්දගාමී වීමක් පෙන්නුම් කළ ද ඉහළ පොලී අනුපාතික වාතාවරණය මධ්‍යයේ අනෙකුත් කාල සීමාවන්ට වඩා කෙටි කාලීන ණය ලබා ගැනීම සඳහා වැඩි වෙළඳපොළ කැමැත්තක් පෙන්නුම් කළේය.

**මාසික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණය[17] මගින් පිළිබිඹු වන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් සමස්ත ණය ප්‍රමාණයෙහි පහළ යෑමට අනුකූලව 2022 වසරේදී සංකෝචනය විය.** බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත ලබා දුන් සමස්ත ණය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසර අවසානයේ පැවති සියයට 21.7ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 8.3කින් සංකෝචනය විය. දැඩි මුදල් තත්ත්වයන් මධ්‍යයේ බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත ලබා දෙන ණය සඳහා වන පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම, සමස්ත ඉල්ලුම් තත්ත්ව පහළ යෑම, ඇතැම් කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීම සීමිත වීම සහ පිරිවැය ඉහළ යෑම, අක්‍රීය ණය හේතුවෙන් ණය අවදානම් ඉහළ යෑම මධ්‍යයේ බලපත්‍රලාභී බැංකු විසින් අනුගමනය කරන ලද ආරක්ෂාකාරී පිළිවෙත සහ ව්‍යාපාර අපේක්ෂා පහළ යෑම ආදී සාධක කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් ණය පහළ යෑම සඳහා හේතු විය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ එක් එක් අංශ වෙත ලබා දුන් ණය සලකා බැලීමේදී, 2022 වසර අවසානය වන විට කෘෂිකාර්මික, කර්මාන්ත සහ සේවා යන අංශ සඳහා ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 6.1කින්, සියයට 6.5කින් සහ සියයට 11.1කින් සංකෝචනය විය. 2021 වසරට සාපේක්ෂව 2022 වසරේදී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත ලබා දුන් නව ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් කෙටි කාලීන වන අතර මැදි හා දිගු කාලීන ණය සැලකිය යුතු ලෙස අඩු විය. මෙමගින්, පෙර වසරට සාපේක්ෂව 2022 වසර තුළදී කාරක ප්‍රාග්ධන අරමුණු සඳහා නව ණය ලබා දීම් ඉහළ යෑමක් සහ ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම හේතුවෙන් ආයෝජන අරමුණු සඳහා වූ ණය ලබා දීම්හි අඩු වීමක් පෙන්නුම් කරයි.

17 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයෙහි සාමාන්‍ය පිරිවැය සහ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් එම අංශය සඳහා ලබා දී ඇති ණය ප්‍රමාණය හඳුනාගැනීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 ජූලි මාසයේ සිට පවත්වනු ලබන මාසික සමීක්ෂණයකි.

### පුළුල් මුදල් සැපයුම ($M_4$)

**$M_{2b}$ පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රවණතාව අනුගමනය කරමින්, මූල්‍ය සමීක්ෂණය[18] මගින් මනිනු ලබන පුළුල් මුදල් සැපයුමේ ($M_4$) වර්ධනය 2022 වසර තුළදී ඉහළ ගියේය.** $M_4$ පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේදී වාර්තා වූ සියයට 13.3 සිට 2022 වසර අවසානය වන විට සියයට 14.3ක් දක්වා ඉහළ ගියේය. වත්කම් අංශය අනුව සලකා බැලීමේදී, 2022 වසර තුළදී $M_4$ පුළුල් මුදල් සැපයුමේ ප්‍රසාරණය සඳහා ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම මුළුමනින්ම දායක වී ඇත. ශුද්ධ දේශීය වත්කම් තුළ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සපයන ලද දේශීය ණය රුපියල් බිලියන 102.3කින් ඉහළ ගිය අතර බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සපයන ලද දේශීය ණය රුපියල් බිලියන 106.8කින් ඉහළ ගියේය. $M_4$ පුළුල් මුදල් සැපයුමට අනුව, 2022 වසර තුළදී රජයට ලබා දුන් ශුද්ධ ණයෙහි වැඩි වීම රුපියල් බිලියන 1,699.3ක් වූ අතර එයින් රුපියල් බිලියන 37.0ක් බලපත්‍රලාභී විශේෂිත බැංකුවලින් ද රුපියල් බිලියන 23.7ක් බලපත්‍රලාභී මුදල් සමාගම් මගින් ද ලබා දෙන ලදී. තවද, ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීමේ බලපෑම පිළිබිඹු කරමින් බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2022 අප්‍රේල් මාසය වන තෙක් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ඉන් අනතුරුව දැඩි මුදල් තත්ත්ව හේතුවෙන් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය පහළ ගියේය. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේදී වාර්තා වූ සියයට 12.7ට සාපේක්ෂව 2022 වසර තුළදී සියයට 6.2ක් විය. බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2022 වසරේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.0ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 65.4කින් ඉහළ ගියේය. මේ අතර, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2022 වසරේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.6ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 83.1කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්,

18 මූල්‍ය සමීක්ෂණය ද්‍රවශීලතාව පිළිබඳ වඩාත් පුළුල් මිනුමක් වන අතර එමගින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු මෙන්ම බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ද ඇතුළුව සියලුම තැන්පතු බාරගන්නා ආයතන ආවරණය කරනු ලබයි.

**7.8 සංඛ්‍යා සටහන**

**පුළුල් මුදල් ($M_4$) සැපයුමෙහි වත්කම් අංශය**
**(මූල්‍ය සමීක්ෂණය අනුව ගණනය කරන ලදී)**

රුපියල් බිලියන

| අයිතමය | 2021 අවසානයට | 2022 අවසානයට (අ) | වෙනස 2021 ප්‍රමාණය | වෙනස 2021 % | වෙනස 2022 ප්‍රමාණය | වෙනස 2022 % |
|---|---|---|---|---|---|---|
| **පුළුල් මුදල් ($M_4$)** | **12,985.4** | **14,839.8** | **1,523.5** | **13.3** | **1,854.4** | **14.3** |
| **තුඩුදුන් සාධක** | | | | | | |
| **ශුද්ධ විදේශීය වත්කම්** | **-998.6** | **-1,766.8** | **-781.5** | **-360.0** | **-768.2** | **-76.9** |
| මුදල් අධිකාරීන් (ආ) | -387.3 | -1,613.9 | -914.0 | -173.5 | -1,226.6 | -316.7 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | -594.7 | -153.0 | 141.5 | 19.2 | 441.8 | 74.3 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | -16.6 | 0.0 | -9.0 | -117.9 | 16.6 | - |
| **ශුද්ධ දේශීය වත්කම්** | **13,984.0** | **16,606.6** | **2,305.0** | **19.7** | **2,622.6** | **18.8** |
| **දේශීය ණය** | **17,296.4** | **20,135.8** | **2,643.9** | **18.0** | **2,839.4** | **16.4** |
| **රජයට ලබා දුන් ශුද්ධ ණය** | **6,769.3** | **8,468.6** | **1,403.6** | **26.2** | **1,699.3** | **25.1** |
| මහ බැංකුව | 2,094.1 | 3,432.5 | 1,225.2 | 141.0 | 1,338.4 | 63.9 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 3,738.3 | 4,038.6 | 59.2 | 1.6 | 300.3 | 8.0 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 844.5 | 881.5 | 102.3 | 13.8 | 37.0 | 4.4 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 92.4 | 116.0 | 16.9 | 22.4 | 23.7 | 25.6 |
| **රාජ්‍ය සංස්ථාවලට/රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය (බලපත්‍රලාභී වාණිජ බැංකු)** | **1,188.1** | **1,747.0** | **185.9** | **18.6** | **558.9** | **47.0** |
| **පෞද්ගලික අංශයට ලබා දුන් ණය** | **9,338.9** | **9,920.2** | **1,054.4** | **12.7** | **581.2** | **6.2** |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 6,981.4 | 7,414.1 | 810.5 | 13.1 | 432.7 | 6.2 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 1,093.7 | 1,159.1 | 157.3 | 16.8 | 65.4 | 6.0 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 1,263.8 | 1,346.9 | 86.7 | 7.4 | 83.1 | 6.6 |
| **අනෙකුත් අයිතම (ශුද්ධ) (ඇ)** | **-3,312.4** | **-3,529.2** | **-339.0** | **-11.4** | **-216.8** | **-6.5** |

(අ) තාවකාලික


(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් මෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන රජයේ රන් පවුම් ශේෂය ද මෙහි අන්තර්ගත වේ.

(ඇ) අනෙකුත් වත්කම් සහ අනෙකුත් වගකීම් අතර වෙනස මගින් ගණනය කරනු ලැබේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

7

**7.16 රූප සටහන**
**මුදල් සමස්තවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (අ)**




(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

$M_4$ පුළුල් මුදල් සැපයුමට අනුව මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් අඩු වීම පිළිබිඹු කරමින් සමස්ත ශුද්ධ විදේශීය වත්කම් 2022 වසර තුළදී රුපියල් බිලියන 768.2කින් අඩු වූ අතර විදේශීය ණය වගකීම් පියවීම හේතුවෙන් වසර තුළදී බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 16.6කින් වැඩි විය.

**$M_4$ පුළුල් මුදල් සැපයුමෙහි වගකීම් අංශය සලකා බැලීමේදී, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙතැති මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතුවල වර්ධනය 2022 වසරේදී ඉහළ ගියේය.** විශේෂයෙන්ම 2022 වසරේ අවසාන කාලයේදී බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පිරිනමනු ලැබූ ඉහළ පොලී අනුපාතික හේතුවෙන් $M_4$ පුළුල් මුදල් සැපයුමට අනුව කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතුවල සමස්ත වර්ධනය ඉහළ ගියේය. ඒ අනුව, $M_4$ පුළුල් මුදල් සැපයුමට අනුව කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසර අවසානයේදී වාර්තා වූ සියයට 11.6ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 16.0කින් වර්ධනය විය. බලපත්‍රලාභී මුදල් සමාගම් වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසරේදී වාර්තා වූ සියයට 5.5ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 11.5කින් වර්ධනය විය. කෙසේ වෙතත්, බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසර අවසානයේදී වාර්තා වූ සියයට 13.5ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 6.8කින් පමණක් වර්ධනය විය. දැඩි ද්‍රවශීලතා තත්ත්වයන් මධ්‍යයේ තැන්පතු ලබා ගැනීම සඳහා තරග කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සාපේක්ෂ වශයෙන් ඉහළ පොලී අනුපාතික පිරිනමනු ලැබීම බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු අඩු වේගයකින් වර්ධනය වීම සඳහා බොහෝ දුරට හේතු විය හැකිය.

7